# කාර්යසාධන වාර්තාව

# 2023

## වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය

නො.19, චෛත්‍ය පාර, කොළඹ 01
දුරකථන : 011-2439352 , 011-2435161
වෙබ්: www.portmin.gov.lk
විද්‍යුත් ලිපිනය : secretary@portmin.gov.lk

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
ආයතනයේ නම - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
වැය ශීර්ෂ අංකය - 176

අන්තර්ගතය | පිටු අංකය


| | | | |
|---|---|---|---|
| පරිච්ඡේදය 01 | - | ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 3-6 |
| පරිච්ඡේදය 02 | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 6-7 |
| පරිච්ඡේදය 03 | - | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 7-13 |
| පරිච්ඡේදය 04 | - | කාර්යසාධන දර්ශක | 13-14 |
| පරිච්ඡේදය 05 | - | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 14-15 |
| පරිච්ඡේදය 06 | - | මානව සම්පත් පැතිකඩ | 15-16 |
| පරිච්ඡේදය 07 | - | අනුකූලතා වාර්තාව | 17-23 |
| පරිච්ඡේදය 08 | - | වෙනත් | |
| | | 8.1 වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 23-37 |
| | | 8.2 ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 38-45 |
| | | 8.3 සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 45-48 |
| | | 8.4 ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් | 48-98 |
| | | 8.5 ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම | 50 |
| | | 8.6 සිවිල් ගුවන්සේවා අධිකාරිය | 50-52 |
| | | 8.7 සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික)සමාගම | 52-56 |
| | | 8.8 සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගම | 57-58 |
| | | 8.9 සීමාසහිත ශ්‍රී ලන්කන් කේටරින් ආයතනය | 58-59 |
| | | 8.10 ඇමුණුම - I (සංවිධාන ව්‍යුහය) වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය | 210 |
| | | 8.11 ඇමුණුම - II (සංවිධාන ව්‍යුහය) වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 213 |
| | | 8.12 ඇමුණුම - III (විගණකාධිපතිවරයාගේ වාර්තාව) | 216 |

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

2030 වසරේදී වරාය, නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රය තුල අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අවශ්‍යවන මෙහෙයවීම, මගපෙන්වීම සහ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. මෙම අමාත්‍යාංශයේ විෂය පථයට නතු වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ්, ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම, සිවිල් ගුවන්සේවා අධිකාරිය, සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින් සහ සී/ස ශ්‍රී ලංකන් කේටරින් යන ආයතනවලට ඒවායේ සංවර්ධන ඉලක්ක ලගා කරගැනීමට මඟපෙන්වීම සිදු කරනු ලබයි.

දකුණු ආසියානු කලාපයේ වරාය, නාවික හා ගුවන් සේවා යන ක්ෂේත්‍රවල උපරිම තරඟකාරිත්වයකින් යුත් සේවා සැපයුම් මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම උදෙසා වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය මේ වන විට විශාල කාර්‍ය භාරයක් ඉටුකරමින් සිටී. වරාය නාවික හා ගුවන් සේවා විෂය පථයට අයත් ඉහත සඳහන් ආයතනයන් හි සියලු කාර්යයන් හා කර්තව්‍යයන් සාර්ථක කරගැනීම සඳහා අදාල අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම මෙම අමාත්‍යාංශය මගින් වැඩිදුරටත් සිදු කරනු ලබයි.

### 1.2 ආයතනයේ, මෙහෙවර, අරමුණු

**දැක්ම**

"දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සමුද්‍රික සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සමුද්‍රීය සේවාවන් ලබාදීම" මෙන්ම "කලාපයේ ප්‍රමුඛතම ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම"

**මෙහෙවර**

"ජාතික ආර්ථික වර්ධනය සඳහා සමුද්‍රික ප්‍රවාහන කටයුතු ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරඟකාරිත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක වරාය හා නාවික සේවාවන් සැලසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙල කිරීම හා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම" මෙන්ම "අදාළ ආර්ථික අංශවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ගුවන් ප්‍රවාහන, සේවා කාර්යක්ෂම, ආරක්ෂිත සහ පරිශීලක- හිතකාමී සේවාවන් බවට පත් කිරීම"

**අරමුණු**

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අනුබද්ධිත ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සපයන්නෙකු, ප්‍රතිපත්ති සම්පාදකයෙකු, සම්බන්ධීකාරකයකු සහ ප්‍රගති සමාලෝචකයෙකු ලෙස කටයුතු කිරීම.

අංක 2289/43 හා 2022.07.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පවරා ඇති රාජකාරි

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වරාය, නාවික හා ගුවන්සේවා විෂයන්ට සහ පහත දක්වා ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම සහ ඇගයීම
   - වෙළඳ නාවික ලේකම් කාර්යාලය
   - ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්
   - සීමාසහිත ලංකා නැව් සංස්ථාව
   - සිවිල් ගුවන්සේවා අධිකාරිය
   - සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
   - සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සහ එහි පාලිත සමාගම්

2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම

3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම

4. වාණිජ වරායන් සංවර්ධනය, කළමනාකරණය හා ඒවායේ ආයෝජන අවස්ථා පුළුල් කිරීම

5. බහළුම් අංගන සංවර්ධනය කිරීම

6. අද්මිරාලයට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධන සහ පරිපාලන කටයුතු

7. නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය

8. නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවන් පැනවීම

9. නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහාය වීම

10. බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනීම

11. නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු

12. වෙරළාසන්න මගී ප්‍රවාහනය

13. නෞකා හිමිකාරිත්වය සහ මෙහෙයුම්, නැව් කළමනාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා

14. රේගු නියෝජිතායතන සහ සමස්ථ නෞකා භාණ්ඩ ප්‍රවාහන විසඳුම්

15. ජාත්‍යන්තර හා දේශීය ගුවන් තොටුපලවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදු කිරීම

16. ගුවන්තොටුපල මඟින් සැලසෙන සේවාවන්වල ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම

17. ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමඟ ගිවිසුම්වල එළඹීම ඇතුලු අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම

18. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ ප්‍රවර්ධනය හා නියාමනය

19. ගුවන් බඩු අපනයනය පුළුල් කිරීම

20. දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම

21. පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය

22. ගුවන්යානා ලියාපදිංචි කිරීම

23. ඉහත දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන්ට අදාළ කටයුතු

24. ඉහත දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

25. පහත දැක්වෙන නීති හා අණ පනත් ක්‍රියාත්මක කිරීම
    - 1971 අංක 11 දරණ ලංකා නැව් සංස්ථා පනත
    - 1972 අංක 10 දරණ නැව් නියෝජිතයින්ට බලපත්‍ර දීමේ පනත
    - 1865 අංක 6 දරණ මාස්ටර්ස් ඇටෙන්ඩන්ට් ආඥාපනත
    - 1971 අංක 52 දරණ වෙළඳ නැව් පනත
    - 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත
    - 1908 අංක 5 දරණ පහයන තටාක හා පේටන්ට් දියත් ආඥාපනත
    - 1900 අංක 4 දරණ බෝට්ටු ආඥාපනත
    - 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත
    - 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත
    - 1982 අංක 02 දරණ ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත
    - 2018 අංක 29 දරණ ගුවන් ප්‍රවාහන පනත
    - 1950 අංක 15 දරණ ගගන යාත්‍රාංගන පනත
    - වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති ඉහත විෂයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

### 1.3 ප්‍රධාන කාර්යයන්

- අනුබද්ධ ආයතනවලට අදාළ ප්‍රතිපත්ති සැකසීම
- අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති සමායෝජනය කිරීම හා අධීක්ෂණය කිරීම
- වරාය, නාවික සහ ගුවන්සේවා කටයුතුවලට අදාල සේවාලාභීන්ට වඩාත් හොඳ සේවාවන් සැලසීම සඳහා නව මෙහෙයුම් නිර්නායකයන් හඳුන්වාදීම
- වරාය, නාවික හා ගුවන්සේවා සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාශීලී යාන්ත්‍රණයක් විධිමත්ව සැකසීම.
- නැව් ඒජන්තවරුන්, බහළු මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්, නැව් බඩු ඉදිරිපත් කරන්නන්, යාත්‍රා හිමිකම් නොමැති පොදු ප්‍රවාහන සේවා සපයන්නන්, සංචාරක ඒජන්තවරුන් හා

වෙනත් සේවා සපයන්නන් සඳහා වඩාත් ක්‍රියාශීලී හා ව්‍යාපාර හිතකාමී නියාමනයක් හා අධීක්ෂණයක් ඇති කිරීම

- ගුවන් යානා සහ මගීන්ගේ ආරක්ෂාව සහතික කරමින් කාර්යක්ෂමව ගුවන් මෙහෙයුම් කටයුතු කිරීම සඳහා ගුවන්සංතරණ සේවා (ගුවන් ගමන් පාලන සේවා, ගගන නාවික සන්නිවේදන සේවා, ගගන නාවික තොරතුරු සේවා), ගිනි නිවීම් සේවා සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම මෙන්ම ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන ආයතනවල කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කරන නීතිමය රාමුවක් හඳුන්වා දීම.

### 1.4 සංවිධාන සටහන

ඇමුණුම I

### 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අදාල නොවේ

### 1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

I. වෙළඳ නාවික ලේකම් කාර්යාලය
II. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්
III. සීමාසහිත ලංකා නැව් සංස්ථාව
IV. සිවිල් ගුවන්සේවා අධිකාරිය
V. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
VI. සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සහ එහි පාලිත සමාගම්

## 02 . පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**විශේෂ ජයග්‍රහණ**

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි මෙහෙයුම් සඳහා නව ගුවන්සංතරණ කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීම.
- විවිධ විෂය පථයන් යටතේ "අමාත්‍ය මණ්ඩල පත්‍රිකා" 131 ක් ඉදිරිපත් කර එයින් 117ක් සඳහා තීරණ ලැබී ඇත.
- "අමාත්‍ය මණ්ඩල සටහන්" 08 ක් ඉදිරිපත් කර එම අමාත්‍ය මණ්ඩල සටහන් 08 සඳහාම තීරණ ලැබී ඇත.
- "ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා" 03 ක් ඉදිරිපත් කර එම ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 03 සඳහාම තීරණ ලැබී ඇත.

**අභියෝග**

- සංවර්ධන කටයුතු සඳහා සුදුසු ආයෝජකයින් සොයා ගැනීම.
- අරමුදල් සපයන ආයතනවලින් මූල්‍ය ආධාර සොයා ගැනීම.

**ඉදිරි ඉලක්ක**

- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල ගැටළු විසඳා ගැනීම සඳහා වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීම.
- වසර ආරම්භයේදී හඳුනා ගන්නා ලද ඉලක්ක අත්පත් කරගැනීම සඳහා ආයතන මෙහෙයවීම.
- තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම සහ එම ඉලක්ක ලඟාකර ගැනීම සඳහා වැඩසටහන්/ ව්‍යාපෘති හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

- කොළඹ වරායේ වර්තමාන ගෝලීය දර්ශකයේ අගය ඉහළ නැංවීම සඳහා දායක වීම.
- භාණ්ඩ හා මගී ප්‍රවාහනයට අනෙකුත් වරායන්හි දායකත්වය වැඩි කිරීම.
- ගුවන්සේවා වඩා කාර්යක්ෂමව, ආරක්ෂාකාරී හා පරිශීලක හිතකාමී තත්වයට දියුණු කිරීම.

## 03. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2023.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

| අයවැය (වර්තමාන වර්ෂය-2023) | | සටහන | තත්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | වර්තමාන වර්ෂය- 2023 රු. | ඉකුත් වර්ෂය-2022 රු. | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 36,562,000,000 | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 38,828,543,756 | 22,248,864,840 | ඒසීඒ-1 |
| 36,562,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **38,828,543,756** | **22,248,864,840** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,888,599,600 | 1,259,115,000 | ඒසීඒ - 3 |
| - | තැන්පතු | | 1,748,009 | 485,884 | ඒසීඒ - 4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 9,231,832 | 15,152,783 | ඒසීඒ - 5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,899,579,441** | **1,274, 753,667** | |
| 36,562,000,000 | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) +(ආ)** | | **40,728,123,197** | **23,523,618,506** | |
| - | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | - | |
| 36,562,000,000 | **ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඈ)** | | **40,728,123,197** | **23,523,618,506** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අඩුකලා : වියදම | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2 (II) |
| 127,500,000 | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 104,734,316 | 113,797,930 | |
| 135,087,520 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 123,235,042 | 107,678,362 | |
| 1,249,750,000 | සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 1,117,569,526 | 649,379,824 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 812,480 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 812,377 | 50.273 | |
| **1,513,150,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,346,351,260** | **870,906,390** | |
| | **මූලධන වියදම්** | | | | ඒසීඒ-2 (II) |
| 24,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 10 | 21,187,424 | 13,268,205 | |
| 500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 497,050 | 671,800 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| 300,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | 55,185,112 | |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 500,000 | 666,500 | |
| 2,123,860,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,807,506,537 | 1,858,999,572 | |
| **2,449,360,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **1,829,691,011** | **1,928,791,189** | |
| - | තැන්පතු ගෙවීම් | | 1,748,009 | 485,884 | ඒසීඒ - 4 |
| - | අත්තිකාරම් ගෙවීම් | | 5,656,256 | 13,709,820 | ඒසීඒ - 5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| - | **ප්‍රධාන ලෙජර වියදම් (ඌ)** | | **7,404,265** | **14,195,704** | |
| **3,962,510,000** | **මුළු වියදම් එ = ( ඊ +උ+ ඌ)** | | **3,183,446,536** | **2,813,893,282** | |
| **32,599,490,000** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ -එ)** | | **37,544,676,661** | **20,709,725,224** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **37,544,676,661** | **20,709,725,224** | ඒසීඒ - 7 ඒසීඒ - 3 |
| | | | **37,544,676,661** | **20,709,725,224** | |

### 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | 2023 වර්ෂය රු. | 2022 වර්ෂය රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, යන්ත්‍රෝපකරණ | ඒසීඒ - 6 | 428,634,551 | 452,157,501 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ - 5/5 (ඒ) | **13,690,793** | 17,266,369 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ - 3 | - | - |
| **මුළු වත්කම්** | | **442,325,344** | **469,423,870** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 13,690,793 | 17,266,369 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 428,634,551 | 452,157,501 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ - 5 (බී) | - | - |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ - 4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ - 3 | - | - |
| **මුළු වගකීම්** | | **442,325,344** | **469,423,870** |

පිටු අංක 07 සිට 09 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 10 සිට 11 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

...............................

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
නම:
තනතුර:
දිනය:

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

...............................

ගණන් දීමේ නිලධාරී
නම:
තනතුර :
දිනය:

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

...............................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/
ප්‍රධාන ගණකාධිකාරී /
අධ්‍යක්ෂ (මුදල්) /
කොමසාරිස් (මුදල්)
නම:
තනතුර
දිනය:

ඩබ්. එස්. පුෂ්පරාණි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

| | තකය | |
|---|---|---|
| | 2023 වර්ෂය<br>රු. | 2022 වර්ෂය<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | - | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 5,106,203 | 4,259,761 |
| අග්‍රිම ලැබීම | 1,888,599,600 | 1,259,115,000 |
| අත්තිකාරම් අයකර ගැනීම | 6,701,657 | 4,102,876 |
| තැන්පතු ලැබීම | 1,748,009 | 485,884 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **1,902,155,469** | **1,267,963,520** |
| **අඩු කලා - මුදල් වැය කිරීම් :** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,345,234,795 | 145,446,466 |
| සහනාධාර සහ මාරු කිරීම් | - | 649,379,824 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 933,960 | 5,113,447 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 5,406,256 | 4,288,526 |
| තැන්පතු ගෙවීම් | 1,748,009 | 485,884 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,353,323,020** | **804,714,147** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) –(ආ)** | **548,832,449** | **463,249,373** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩු කලා - මුදල් වැය කිරීම්:** | | |
| මූලධන වියදම් | 548,832,449 | 463,249,373 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **548,832,449** | **463,249,373** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) – (ඉ)** | **(548,832,449)** | **(463,249,373)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)** | - | - |

| | | |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඍ)** | - | - |
| **අඩු කළා - මුදල් වැය කිරීම් :** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඍ) – (එ)** | - | - |
| **මුදල් වල ශුද්ධ වෙනස් වීම (ඔ) = (උ) + (ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය
   2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.
2. මිනුම්කරණ පදනම
   මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
   මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.
3. ආදායම් හඳුනාගැනීම
   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.
4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම
   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.
5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය
   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.
6. මුදල් හා මුදල් සමාන දෑ
   2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2003.02.08 | අපගමන බද්ද | 35,000,000,000 | 36,562,000,000 | 38,828,543,756 | 106.20 |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසන් ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,406,100,000 | 1,513,150,000 | 1,346,351,260 | 88.98 |
| ප්‍රාග්ධන | 2,153,000,000 | 2,449,360,000 | 1,829,691,011 | 74.70 |

### 3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | බහුකාර්ය සංවර්ධන සහායකයන්හට 2023 වර්ෂය සඳහා වැටුප් හා දීමනා ගෙවීම | 740,250.00 | 740,250.00 | 717,500.00 | 96.93 |
| 2 | විශ්‍රාම වැටුප් දෙර්තමේන්තුව | විශ්‍රාම ගිය නිලධාරියකුගේ රජයට අයවිය යුතු ණය ශේෂ, පාර්තෝෂිකයෙන් අයකර ගැනීම | 216,210.00 | 216,210.00 | 216,210.00 | 100.00 |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු. | ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි ව්‍යුහය | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 428,634,551 | - | - |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම III

## 04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 - 90 % | 75 - 89% | 50-74 % |
| කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 04ක් පැවැත්වීම | √ | | |
| ප්‍රගති වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම | √ | | |
| කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කිරීම සහ පාර්ලිමේන්තුව වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| අයවැය විවාද කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කර ඉදිරිපත් කිරීම | √ | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ භාෂාත්‍රයෙන්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම | √ | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ නියමිත දිනට ඉදිරිපත්කිරීම | √ | | |
| අවශ්‍ය අවස්ථාවලදී අනුබද්ධිත ආයතන සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සම්බන්ධීකරණය | √ | | |
| අමාත්‍ය මණ්ඩල සහ අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම | √ | | |

| | | | |
|---|---|---|---|
| විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම 4ක් පැවැත්වීම (කාර්තුමය) | | √ | |
| අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන සඳහා අභ්‍යන්තර විගණනයන් පැවැත්වීම | √ | | |
| විගනණ විමසුම් සඳහා පිළිතුරු සැපයීම | √ | | |
| අදාල ආයතන සඳහා මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | √ | | |
| අයවැය ඇස්තමේන්තු සකස්කිරීම | √ | | |
| ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කිරීම | √ | | |
| භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම සහ වාර්තා කිරීම | √ | | |
| සැපයුම් කළමනාකරණය | √ | | |
| මූල්‍ය පුරෝකථන සකස් කිරීම | √ | | |
| ගෙවීම් (වැටුප් සහ වේතන, අතිකාල, ණය) | √ | | |
| පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | √ | | |
| අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි නීතිමය කටයුතු | √ | | |
| වාහන නඩත්තු | √ | | |
| ආයතනයන්හි පරිපාලන කටයුතු | √ | | |
| පුහුණු සහ ශිෂ්‍යත්ව | √ | | |
| සේවක සුබසාධනය | √ | | |
| මානව හිමිකම් කමිටුව, මහජන පෙත්සම් කාරක සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සඳහා සහභාගී වීම | √ | | |

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0 - 49% | 50 - 74% | 75 - 100% |
| සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා අනුබද්ධ ආයතනවලට පහසුකම් සැපයීම | සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති සංකල්ප ගණන | | | √ |
| සවිමත් යටිතල පහසුකම් ගොඩ නැගීම, පර්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම | මුහුදු මගින් භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය | ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය | | | √ |
| | | ප්‍රවාහනය කරන ලද මගීන් සංඛ්‍යාව | | | √ |
| | ගුවන් මගින් භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය | ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය | | | √ |
| | | ප්‍රවාහනය කරන ලද මගීන් සංඛ්‍යාව | | | √ |
| ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසාර | වරාය හා නාවික ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ට වඩා | වරාය හා නාවික කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය | හොඳ පහසුකම් සැපයීම | | | | |
| | නාවිකයන් ලියාපදිංචි කිරීම | ලියාපදිංචි කර ඇති නාවිකයින් සංඛ්‍යාව | | | √ |
| පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම | ආධුනික නාවිකයින් සඳහා පුහුණු අවස්ථා ලබා දීම | පුහුණු කර ඇති ආධුනික නාවිකයින් සංඛ්‍යාව | | | √ |
| | ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති මහපොළ පුහුණු ආයතනය මගින් පාසැල හැරයන තරුණ ප්‍රජාවට පුහුණු අවස්ථා ලබා දීම | වරාය හා නාවික ක්ෂේත්‍රයට අදාලව ලබා දී ඇති පුහුණු අවස්ථා සංඛ්‍යාව | | √ | |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

- තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක වුවද, ප්‍රතිඵල/ ප්‍රගතිය ගණනය කිරීම සඳහා පදනම් වන මූලික දත්ත සපයා ගැනිම අපහසුවීම
- අංශ මත පදනම්වූ පුහුණු / වැඩමුළු වල අවශ්‍යතාව.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව 2023.12.31 | ඇබෑර්තු* / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 22 | 20 | 2 |
| තෘතීයික | 3 | 1 | 2 |
| ද්විතීයික | 61 | 56 | 5 |
| ප්‍රාථමික | 27 | 27 | 0 |

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ආයතනයේ දෛනික රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා පුරප්පාඩු පිරවීම අත්‍යවශ්‍ය වේ.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 01 | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 01 | අවුරුදු 02 | 369,000.00 | දේශීය | ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කිරීම |
| 02 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 02 | දින 02 | 36,000 | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සම්බන්ධ පුහුණුව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 | ප්‍රසම්පාදනය සම්බන්ධ උසස් ජාතික ඩිප්ලෝමාව | 01 | මාස 14 | 120,000.00 | දේශීය | ප්‍රසම්පාදනය සම්බන්ධ උසස් ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම |
| 04 | දෙමළ භාෂා පාඨමාලාව | 35 | පැය 150 | 150,000.00 | දේශීය | දෙමළ භාෂාව පිළිබඳ කථන හා ලිඛිත කුසලතා වර්ධනය |
| 05 | පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | අවුරුදු 02 | 183,000.00 | දේශීය | පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම |
| 06 | තොරතුරු තාක්ෂණය හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 01 | අවු 01 | 35,000.00 | දේශීය | තොරතුරු තාක්ෂණය හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම |
| 07 | රජයේ වාහන නඩත්තුව සම්බන්ධ පුහුණුව | 01 | දින 01 | 5,000 | දේශීය | රජයේ වාහන නඩත්තුව සම්බන්ධ පුහුණුව |
| 08 | නිවාඩුභාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ පුහුණුව | 01 | දින 01 | 5,000 | දේශීය | නිවාඩු විෂය සම්බන්ධ දැනුම |
| 09 | කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ වෘත්තීය සංවර්ධන වැඩසටහන | 05 | දින 01 | 25,000 | දේශීය | කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය |
| 10 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 01 | දින 03 | 18,000 | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සම්බන්ධ පුහුණුව |

*** ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීම.
- නිලධාරීන් අභිප්‍රේරණය කිරීම.
- රාජකාරිය වඩාත් කාර්යක්ෂම කිරීම.
- වෘත්තීය පරිණතභාවයකින් යුතු කාර්යක්ෂම නිලධාරීන් රාජ්‍ය සේවයට දායාද කිරීම

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ. | | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ. | | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය) GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ. | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | 03 | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු විය. | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ. | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල වේ. | | |
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල නොවේ. | වසර අවසානයේ මුදල් පොතේ ශේෂය ශුන්‍ය වේ. | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල නොවේ. | ආපසු ගෙවීම් සිදුකර නොමැත. | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව, මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ. | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |

## 08. පරිච්ඡේදය

## 8.1 වෙළඳ නාවික ලේකම් කාර්යාලය

### 8.1.1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

#### 8.1.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වෙළඳ නාවික කටයුතු පරිපාලනය භාර ආයතනය වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය සමුද්‍රීය කටයුතු අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම් භාරය දරනු ලැබේ. මෙම ආයතනයේ කටයුතු මූලිකව පාලනය වන්නේ 1971 අංක 52 දරන වෙළඳ නැව් කටයුතු පණත, 1972 අංක 10 දරණ නැව් ඒජන්තවරුන්ට බලපත්‍රදීමේ පණත, 1913 අංක 40 දරණ අද්මිරාල්ති අධිකරණ බලය පිළිබඳ පණතේ අදාළ වගන්ති සහ ඉන් පසුකාලීනව සම්පාදනය කර ඇති රෙගුලාසි වලිනි. වෙළඳ නාවික ලේකම් කාර්යාලය ඉටු කරන්නේ මුහුදේ සැරිසරන ජීවිතවල සහ දේපළවල ආරක්ෂාව, සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව, ප්‍රවීණත්වය ඇගයීමෙන් පසු සහතික දීම, ශ්‍රී ලංකා ධජයා යටතේ නැව් ලියාපදිංචි කිරීම, නැව් එජන්තවරුන්ට, බහළුම් මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්ට, බහළුම් පර්යන්ත මෙහෙයුම්කරුවන්ට, බහළුම් නැව් බඩු මෙහෙයුම්කරුවන්ට, නැව් බඩු ඉදිරිපත් කරන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවෙකු නොවන පොදු ප්‍රවාහකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ අදාළ වන සියලු ජාතික සහ ජාත්‍යන්තර සම්මුති සහ රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මකවීම පිළිබඳ වගකීමය. ශ්‍රී ලංකාව තුළ ස්වකීය සුවිශාල වගකීම්භාරය වශයෙන් මෙම ආයතනය මගින් ආරක්ෂිතව සමුද්‍රීය කටයුතු කිරීම් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සීමාව තුළ වුව ද නැව් ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ රෙගුලාසි පිළිපදින්නේ දැයි පරීක්ෂා කරබැලීම (ධජ රාජ්‍ය පාලනය හා වරාය රාජ්‍ය පාලනය) ඇතුළු සුවිශාල කාර්යයන් රැසක් ඉටු කිරීමට මෙම ආයතනයට පැවරී ඇත.

8.1.1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

"සාමුද්‍රික විශිෂ්ඨතාව තුලින් ජගත් නාවුක කර්මාන්තයේ පිළිගැනීම"

8.1.1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ සියලු නාවික කටයුතු සම්බන්ධයෙන් නීති රීති සම්පාදනය කොට නියාමනය කිරීම හා ජාත්‍යන්තර සමුද්‍රීය ප්‍රඥප්තිවලට අනුකූලව, දේශීය නීති රෙගුලාසි සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- වෙළඳ නාවිකයන් සඳහා අඛණ්ඩ මුදාහැරීමේපත් නිකුත් කිරීම (CDC) සහ ඔවුන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව විභාග පවත්වා නැව්පති (කපිතාන්) සහ ප්‍රධාන නාවික ඉංජිනේරු යන මට්ටම් දක්වා වන ප්‍රවීණතා සහතිකපත් (COC) නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත වෙළඳ නාවිකයන් පුහුණු කිරීමේ ආයතන අනුමත කිරීම, නියාමනය කිරීම, ඒවායේ කටයුතු අධීක්ෂණය හා විගණනය කිරීම.
- ශ්‍රී ලංකා ධජය යටතේ නෞකා ලියාපදිංචි කිරීම සහ එම නෞකාවල තත්වය පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත සහතික නිකුත් කිරීම, ගාස්තු අය කිරීම හා ශ්‍රී ලාංකික නෞකා වර්ගීකරණ සංගම්වල කටයුතු අධීක්ෂණය කිරීම.
- විදේශීය නෞකා ශ්‍රී ලංකා වරායන් කරා සේන්දු වූ විට එහි සේවය කරනු ලබන නාවිකයන් සඳහා සපයන වැටුප්, සෞඛ්‍ය, ආහාර හා අනෙකුත් සේවා පහසුකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීම.
- ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ නාවික ගමනාගමනයට පවත්නා අනතුරු, බාධක ඉවත් කිරීම හා එවැනි ස්ථාන සිතියම්ගත කර ප්‍රසිද්ධියට පත්කිරීම.
- ශ්‍රී ලංකා මුහුදු තීරයෙහි සැරිසරන විදේශ වෙළඳ නෞකා සහ ශ්‍රී ලංකා ධජයා යටතේ පවත්නා වෙළඳ නෞකාවලට සිදුවන හදිසි අනතුරු පිළිබඳව ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව පරීක්ෂණ පවත්වා ඒ පිළිබඳව වාර්තා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාවේ ජලතීරය තුළදී විනාශයට පත්ව ඇති නෞකා සුන්බුන්වල ප්‍රධාන භාරකරු ලෙස කටයුතු කරමින් ඒවා යථායෝග්‍ය පරිදි අපහරණය කිරීම.
- "වරාය රාජ්‍ය පාලනය" (Ports State Control) පිළිබඳ ඉන්දියානු සාගර අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රී ලංකා වරායයන් වෙත සේන්දුවන නෞකාවලින් 10% ක් වූ අවම ප්‍රමාණයක්වත් ජාත්‍යන්තර සමුද්‍රීය සම්මුතීන්ට හා ප්‍රමිතීන්ට අනුකූල වන්නේදැයි පරීක්ෂා කිරීම හා අවශ්‍ය වේ නම්, මුහුදු ප්‍රවාහනයට නුසුදුසු නෞකා රඳවා තබා ගැනීම.
- ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතවරුන්, බහළුම් මෙහෙයුම්කරුවන්, නැව්බඩු ගෙනයන්නන්, හා යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් සඳහා බලපත් නිකුත් කිරීම සහ එම නියෝජිතයන්ගේ කටයුතු නියාමනය කිරීම.
- 1913 අංක 40 දරණ අද්මිරාල්ති අධිකරණ බලසීමා පනත හා 1991 මහාධිකරණ (අද්මිරාල්ති අධිකරණ බලසීමා) නියෝග යටතේ ශ්‍රී ලංකාවේ මහාධිකරණ අද්මිරාල්ති උසාවිය විසින් තීන්දු කරනු ලබන පරිදි නෞකා අත් අඩංගුවට ගැනීම, ආරක්ෂකභාරයට ගැනීම සහ මුදාහැරීම හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

8.1.1.4 සංවිධාන ව්‍යුහය

ඇමුණුම II

8.1.1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

යාපනය උප කාර්යාලය

8.1.1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

නැත

8.1.1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාල නොවේ

8.1.2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

8.1.2.1 ඉදිරි සැලසුම්

කෙටිකාලින

- IMO හා ILO සම්මුතීන්ට අනුකූලව දේශීය නීතිරීති සකස්කිරිම හා අවශ්‍යතාවය පරිදි යාවත්කාලීන කිරීම.
- STCW – (fishing vessel) සම්මුතිය අපරානුමත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු.
- STCW I/10 රෙගුලාසියට අනුකූලව සමාන සහතික පිළිගැනීම සම්බන්ධයෙන් සුදුසු සාමාජික රටවල් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- වෙරළාසන්න නාවික කටයුතුවලට අදාල රෙගුලාසි සකස් කිරීම

දීර්ඝකාලීන

- මහජනයා සඳහා විනිවිදභාවයෙන් යුතු කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා තත්ත්ව පද්ධති හඳුන්වාදීම, යාවත්කාලිනකිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම.
- නාවික ක්ෂේත්‍රයේ නව ගෝලීය ප්‍රවණතාවයන් සඳහා අවශ්‍යවන නීතිරීති යාවත්කාලීන කිරීම සහ සංශෝධනය කිරීම.
- කාර්යාල ඩිජිටල්කරණ මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම

8.1.3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

8.1.3.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය -** වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (පිටු අංක 35)හි ඇතුලත් කර ඇත.

8.1.3.2 **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය -** වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (පිටු අංක 36)හි ඇතුලත් කර ඇත.

8.1.3.3 **මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය -** වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (පිටු අංක 33)හි ඇතුලත් කර ඇත.

8.1.3.4 **මූල්‍ය ප්‍රකාශ සටහන් -** වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (පිටු අංක 37)හි ඇතුලත් කර ඇත.

8.1.3.5ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්මේන්තුව | | එකතුකරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2003.02.22 | වෙළඳ නාවික ලේකම් කාර්යාලයට අදාළ ගාස්තු | 160,000 | 170,000 | 198,254 | 116.62% |

8.1.3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 109,900 | 117,300 | 115,738 | 98.67% |
| ප්‍රාග්ධන | 7,000 | 10,670 | 9,679 | 90.71% |

8.1.3.7 මු.රෙ. 201 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අදාල නොවේ

8.1.3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (පිටු අංක.....)

8.1.3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

8.1.4 කාර්යසාධන දර්ශක

8.1.4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 - 90 | 75 - 19 | 50 - 74 |
| **ව්‍යාපෘතියේ නම:** ILO සම්මුතියට අනුකූලව ජෛවමිතික අංග එකතු කරමින් සියලුම ශ්‍රී ලාංකික නාවිකයින්ට හැඳුනුම්පතක් නිකුත් කිරීම<br>i. ලංසු ලියකියවිලි සකස් කිරීම. (මෘදුකාංග, පෙර මුද්‍රණ කාඩ්පත්, මුද්‍රණ යන්ත්‍ර, ඇඟිලි මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර් සහ වෙනත්)<br>ii. ලංසු කැඳවීම<br>iii. ලංසු ඇගයීම<br>iv. ප්‍රසම්පාදනය සහ ගෙවීම | 100<br>100<br>100<br>100 | | |

### 8.1.5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

#### 8.1.5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%) | | |
|---|---|---|---|---|---|
| | | | 0- 49 | 50- 74 | 75- 100 |
| තිරසාර පූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියළු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම. | 1. පරිගණකගත නවීන තාක්ෂණය ඇතුලත් තාක්ෂණික ක්‍රම තුලින් සේවා ඵලදායීතාවය ඉහළ නැංවීම. | 1. CDC හා COC සහතිකපත්‍ර නිකුත් කිරිමට ගතවන කාලය අඩුවීම<br>2. ලැබෙන මහජන පැමිණිලි අඩුවීම.<br>3. ලැබෙන අතිරේක සේවාවන් (සහතික භෞතික වශයෙන් ගබඩා කිරිමට අවශ්‍ය නොවීම) | | | 100<br>90<br>100 |
| | 2. යාපනය හා දූපත් අතර ආරක්ෂිත බෝට්ටු ප්‍රවාහනයක් තුලින් සේවාලාභීන්ගේ ජන ජීවිතයේ ආර්ථීක, සමාජීය වර්ධනය ඉහළ නැංවීම. | 1. සමීක්ෂණය කරන ලද බෝට්ටු සංඛ්‍යාව ඉහළයාම. | | 50 | |
| | 3. නෞකාවල නාවිකයන්ගේ සේවා නියුක්තිය වර්ධනය විම තුලින් ජාතික ආර්ථික වර්ධනයට දායකවිම. | 1. නාවිකයන් සේවයේ යෙදවීම ඉහල යාම | | | 100 |
| | 4. නාවිකයන් සඳහා අවශ්‍ය නෞකාවල මූලික පුහුණු අවස්ථා සලසා දීම. | 1. මූලික පුහුණු අවශ්‍යතාවය සපුරා දීම | | 50 | |
| | 5. නාවික සහතිකපත් එක්දින සේවාව යටතේ නිකුත් කිරීම. | 1. සහතික නිකුත් කිරීමට ගතවන කාලය අවම වීම | | | 100 |

#### 8.1.5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- නෞකාවල සේවය සඳහා අවශ්‍ය මූලික පුහුණුව ලබාදීමෙන් පසුව ඔවුන්ගේ රැකියා අවස්ථා සුලභ වී ඇති අතර පලපුරුදු නාවිකයෙකු බිහිකිරීමටද හැකිවී ඇත.
- එක්දින සේවාව මඟින් නාවිකයන්හට කලට වේලාවට රැකියා සඳහා යොමුවීමට හැකිවී ඇත.

### 8.1.6 මානව සම්පත් පැතිකඩ

#### 8.1.6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 25 | 10 | 15 |
| තෘතීයික | 4 | 1 | 3 |
| ද්විතීයික | 66 | 48 | 18 |
| ප්‍රාථමික | 30 | 14 | 16 |

#### 8.1.6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ දෛනික රාජකාරි කටයුතු සඳහා පුරප්පාඩු පිරවීම අත්‍යවශ්‍ය වේ.

#### 8.1.6.3 මානව සම්පත් සංවර්ධනය

2023 වසර තුළ දේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 03 දෙනෙකු සහභාගී වී ඇත.

### 8.1.7 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාළ නැත | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නැත | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නැත | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | අදාළ නැත | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2011 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මගින් සකස් කරයි | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මගින් සකස් කරයි | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මගින් සකස් කරයි | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මඟින් සකස් කරයි | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 01 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2001 හා 05/2011(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2011.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2011 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව, මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ඒසීඒ-සී**

| | තතය | |
|---|---|---|
| | 2023<br>රු. | 2022<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 198,254,438 | 49,747,183 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 2,263,859 | 2,093,539 |
| අග්‍රිම ලැබීම් | 136,372,616 | 105,879,190 |
| අත්තිකාරම් අයකර ගැනීම | 3,132,187 | 6,239,266 |
| තැන්පතු ලැබීම් | 882,750 | 669,450 |

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **340,905,850** | **164,628,628** |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 111,283,116 | 83,341,536 |
| සහනාධාර සහ මාරුකිරීම් | 4,137,278 | 5,412,323 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,575,750 | 6,978,240 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 210,784,232 | 49,913,191 |
| අත්තිකාරම් ගෙවීම් | 2,811,701 | 6,993,287 |
| තැන්පතු ගෙවීම් | 634,750 | 669,450 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **331,226,826** | **153,308,026** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ ) =(අ)-(ආ)** | **9,679,024** | **11,320,602** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 9,679,024 | 11,320,602 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 9,679,024 | 11,320,602 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | (9,679,024) | (11,320,602) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

| අයවැය 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු | තත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | ඒසීඒ-1 |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 198,254,438 | 49,747,183 | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **198,254,438** | **49,747,183** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 136,372,616 | 105,879,190 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 882,750 | 669,450 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 3,259,423 | 1,953,057 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **140,514,789** | **108,501,697** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **338,769,227** | **158,248,880** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 210,784,232 | 49,913,191 | |
| - | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **127,984,96** | **108,335,689** | |
| - | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | - | ඒසීඒ-2(ii) |
| 49,550,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 49,266,254 | 44,444,924 | |
| 63,350,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 62,280,504 | 38,904,841 | |
| 4,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 4,137,278 | 5,412,323 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 54,398 | 46,248 | |
| **117,300,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **115,738,434** | **88,808,335** | |
| | **මූලධන වියදම්** | | | | |
| 1,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 833,900 | 84,460 | |
| 3,400,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 3,382,081 | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | - | - | ඒසීඑ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 193,692 | 626,396 | |
| 5,270,000 | වෙනත් මූලධන වියදම් | 15 | 5,269,350 | 10,609,746 | |
| 10,670,000 | මුළු මූලධන වියදම් (උ) | | 9,679,024 | 11,320,602 | |
| | තැන්පතු ගෙවීම් | | 634,750 | 669,450 | ඒසීඑ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 2,561,701 | 6,993,287 | ඒසීඑ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 3,196,451 | 7,662,737 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 128,613,908 | 107,791,674 | |
| 127,970,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (628,912) | 544,015 | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (628,912) | 544,015 | ඒසීඑ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 0 | 0 | ඒසීඑ-3 |
| | | | (628,912) | 544,015 | |

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඑ-පී

| | සටහන | කතාය | |
|---|---|---|---|
| | | 2023 රු. | 2022 රු. |
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඑ-6 | 98,297,880 | 94,915,798.70 |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඑ-5/5(ඒ) | 4,342,508 | 5,040,229.80 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඑ-3 | - | 39,670,090.07 |
| මුළු වත්කම් | | 102,640,388 | 139,626,118.57 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 4,094,508 | 5,040,229.80 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 98,297,880 | 94,915,798.70 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඑ-5(බී) | | - |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඑ-4 | 248,000 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඑ-3 | - | 39,670,090.07 |
| මුළු වගකීම් | | 102,640,388 | 139,626,118.57 |

මූල්‍ය ප්‍රකාශ සටහන්

1.වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2.මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3.ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4.දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5.දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6.මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

පිටු අංක 35 සිට 36 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 37 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර: | තනතුර : |
| දිනය : | දිනය: | දිනය : |

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඩබ්. එස්. පුෂ්පරාණි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

## 8.2 ශ්‍රී ලංකා වරාය අධිකාරිය

### 8.2.1 හැඳින්වීම

සමුද්‍රීය යටිතල පහසුකම් සහිත වූ ගතික පරිසරයක් තුළ වරාය සංවර්ධන හා වාණිජ සේවා සැපයුම් ක්ෂේත්‍රයේ කලාපීය ප්‍රමුඛයෙකු ලෙස සිය ස්ථානය ස්ථාවරව පවත්වා ගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2023 වර්ෂයේ අභිප්‍රායික ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සංවර්ධන, කොන්ත්‍රාත් හා සැලසුම් හා සංවර්ධන යන කොට්ඨාශ වල මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම ක්‍රමෝපායික පියවරයන් ශ්‍රී ලංකාව සතු සමුද්‍රීය ශක්‍යතාවයන් පාදක වූ සුවිශාල වැදගත්කමක් දරනු ලබන අතර සැලකිය යුතු ආර්ථික වර්ධනයක් ගොඩනැගීමට දායක වේ. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් හරහා 2023 වර්ෂය තුළ අත්කරගත් විශිෂ්ට ප්‍රගතිය, රටෙහි සමුද්‍රීය ක්ෂේත්‍රය දියුණුකිරීමට හා ඉහළම ඵලනෙලා ගැනීම සඳහා ආයතනයේ කැපවීම අවධාරණය කරනු ලබයි.

**දැක්ම**

"සේද මාවතේ විශිෂ්ටතම සමුද්‍රීය සේවා සැපයුම්කරු බවට පත්වීම"

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් 1979 අගෝස්තු 01 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලද අතර 1984 අංක 7 සහ 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත.

- නැව් භාණ්ඩ වාහක, නැව්ගත කිරීම් සහ ප්‍රතිනැව්ගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම්, වාෂ්පු කටයුතු, නෞකා වලට ජලය, ඉන්ධන සහ විදුලිය සැපයීම, නෞකා වලට හා නෞකා වලින් ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ලිහිසි තෙල් මෙහෙයුම් කිරීම බන්කර් සහ ඉන්ධන ගබඩා අතර කාර්යයන්, නියමු කටයුතු සහ නෞකා බැඳතැබීමේ කටයුතු, කිමිදුම් සහ නෞකා දිය යටදී අළුත්වැඩියා කිරීම හා එවැනි වෙනත් අනුශාංගික වූ ඕනෑම කාර්යයක් සඳහා කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම.
- සැසඳුම් හා ආරක්ෂක සේවා කාර්යක්ෂමව හා නිත්‍ය ලෙස සැපයීම.
- වරායේ සීමාවන් සහ ප්‍රවේශයන් තුළ නාවික කටයුතු නියාමනය කිරීම සහ පාලනය කිරීම.
- වරාය ගොඩනැගිලි නඩත්තු කිරීම හා භාවිතය ප්‍රවර්ධනය කිරීම, වරායයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම.
- රේගු දෙපාර්තමේන්තුවට අදාල කාර්යයන් හැර ඕනෑම නිශ්චිත වරායක් තුළ අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.
- නිශ්චිත වරායන් තුළට සහ ඉන් පිටතට යාත්‍රා කිරීම සඳහා අවශ්‍ය වන යාත්‍රාවලට මඟ පෙන්වීම සහ ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ සහ ඉන් ඔබ්බෙහි ආලෝකය සහ වෙනත් ක්‍රම ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම.
- පනත මගින් වරාය අධිකාරියට පනවා ඇති වෙනත් රාජකාරි ඉටු කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම, වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම, නව ආයෝජනවල යෙදවීම, අධිකාරියේ වියදමට නොඅඩු ආදායමක් ලැබෙන පරිදි වරාය අධිකාරිය පනතේ

විධිවිධාන වලට අනුකූලව අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සුදුසු පරිදි ගාස්තු අයකර ඒවා අධිකාරියේ ආදායමට බැර කර ප්‍රමාණවත් පොදු මූල්‍ය සංචිතයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාමට හැකිවන ආකාරයෙන් වරාය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සහ;

- වරාය අධිකාරිය පනතෙහි දැක්වෙන විධිවිධානවලට අනුකූලව, නිශ්චිත වරායන් සහ ඒ සෑම එකක්ම ස්වයං ආධාරක ව්‍යවසායක් ලෙස කළමනාකරණය කිරීමට ප්‍රයත්ත දැරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව, වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ. සභාපතිවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි සමස්ත පරිපාලනය ඔහු භාරයේ පවතී.

### 8.2.2 ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

#### 1. නැගෙනහිර බහළු පර්යන්තය

කොළඹ දකුණු වරායේ නැගෙනහිර බහළු පර්යන්තය, මීටර් 18 සිට මීටර් 20 දක්වා පරාසයක ගැඹුර සහිත නැංගුරම්පොළවල මීටර් 400 ක් හෝ ඊට වඩා වැඩි දිගින් යුත් අති විශාල බහළු ප්‍රවාහන නෞකා තුනකට නැංගුරම්ලෑමේ පහසුකම් සැපයීම සඳහා සැලසුම් කර ඇත. මෙම පර්යන්තය ආසන්න වශයෙන් හෙක්ටයාර් 72 ක භූමි ප්‍රදේශයක විහිදෙන අතර වාර්ෂික විස්සේ සම ඒකක මිලියන 3ක බහළු මෙහෙයුම් ධාරිතාවයකින් යුක්ත වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2015 වසරේදී මීටර් 600 ක ජැටි බැම්මක්, මීටර් 440 ක මෙහෙයුම් නැංගුරම්පොළක්, හෙක්ටයාර 18 ක අංගනයක්, පර්යන්ත මාර්ග හා අදාළ ගේට්ටු පහසුකම්වල ඉදිකිරීම් අවසන් කරන ලදී. නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර - I හි මෙහෙයුම් 2020 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ විය.

හවුල් ව්‍යාපාරයක් වන ඇක්සස් ඉංජිනියරින් පීඑල්සී හා සී/ස චයිනා හාබර් ඉංජිනියරින් සමාගම විසින් නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර II හි සිවිල් ඉදිකිරීම් වැඩ 2022.01.04 දින ආරම්භ කර ඉදිකිරීම් මේ වන විට ක්‍රියාත්මකව පවතී. දැනට පවත්නා මීටර් 600 ක් දිග ජැටි බැම්ම සඳහා මීටර් 18 ගැඹුර සහිත නැංගුරම්පොළක් පවතින අතර ඉතිරි මීටර් 700 ක ජැටි බැම්ම සඳහා මීටර් 20 ක් ගැඹුරැති නැංගුරම්පොළක් ඉදි කිරීමට සැලසුම් කර ඇත. සිවිල් ඉදිකිරීම් වැඩ වල සමස්ත භෞතික ප්‍රගතිය 24.5% ක් වේ.

#### 1.1 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා උපකරණ ප්‍රසම්පාදනය

නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් සාර්ථකව සිදු කිරීම සඳහා පහත සඳහන් උපකරණ සමූහය ප්‍රසම්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

**අ) නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර (STS) 12 ක් සහ රේල් පීලි මත දිවෙන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර (ARMGs) 40 ක් ප්‍රසම්පාදනය කිරීම.**

| | | |
|---|---|---|
| සමස්ත කොන්ත්‍රාත් මිල | - | ඇ.එ.ජ.ඩොලර් මිලියන 282 |
| පළමු තොගය (නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන (STS) දොඹකර ක් 06 රේල් පීලි මත දිවෙන ගැන්ට්‍රි දොඹකර (ARMGs) 20ක්) භාර දීමේ ඇස්මේන්තුගත දිනය | - | 2024 දෙවන කාර්තුව |
| භෞතික ප්‍රගතිය | - | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර ඉදිකිරීම් වැඩ සිදු කෙරෙමින් පවතී. |
| මූල්‍ය ප්‍රගතිය | - | ඇ.එ.ජ.ඩොලර් මිලියන 141 (ඇ.එ.ජ.ඩො.මි. 113 + ඇ.එ.ජ.ඩො.මි. 28) |

ආ) ස්ට්‍රැඩල් කැරියර්ස් 15 ක් ප්‍රසම්පාදනය කිරීම

| | | |
|---|---|---|
| භාරදීමේ ඇස්තමේන්තුගත දිනය | - | 2025 දෙවන කාර්තුව |
| ඇස්තමේන්තුගත පිරිවැය | - | ඇ.එ.ජ.ඩොලර් මිලියන 25 |
| භෞතික ප්‍රගතිය | - | ලංසු කැඳවා ඇත. |

ඇ) ස්ට්‍රැඩල් කැරියර්ස් 15 ක් ප්‍රසම්පාදනය කිරීම

| | |
|---|---|
| භාරදීමේ ඇස්තමේන්තුගත දිනය | - 2025 තෙවන කාර්තුව |
| ඇස්තමේන්තුගත පිරිවැය | - ඇ.එ.ජ.ඩොලර් මිලියන 25 |
| භෞතික ප්‍රගතිය | - ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. |

### 1.2 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ල

නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර - II සංවර්ධන ව්‍යාපෘතියේ අංගයක් ලෙස නැගෙනහිර බහළු පර්යන්තය සඳහා රුපියල් මිලියන 1,600 ක ඇස්තමේන්තුගත පිරිවැයකට මහල් හතරකින් යුත් මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙහි ඉදිකිරීම් කටයුතු 2023 ජූලි මස ආරම්භ කරන ලද අතර වසර අවසානය වන විට මූලික සිවිල් වැඩවලින් 57% ක් පමණ අවසන් කර ඇත.

### 2. බටහිර බහළු පර්යන්තය - I (WCT – I)

කොළඹ දකුණු වරායේ බටහිර බහළු පර්යන්තය - I මීටර් 20 ක් ගැඹුරැති නැංගුරම්පොළ මීටර් 400 ක් හෝ ඊට වඩා වැඩි දිගින් යුත් අති විශාල බහළු නෞකා තුනකට නැංගුරම්ලෑමේ පහසුකම් සැපයිය හැකි වන ලෙස සැලසුම් කර ඇති මීටර් 1400 ක් දිග ජැටි බැම්මකින් සමන්විත පර්යන්තයක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර ඇත. ආසන්න වශයෙන් හෙක්ටයාර 65 ක භූමි ප්‍රදේශයක ඉදිවන මෙම පර්යන්තය මගින් වාර්ෂිකව බහළු විස්සේ සම ඒකක මිලියන 3.0 ක් මෙහෙයුම් කිරීමට සැලසුම් කර ඇත.

වසර 35 ක් සඳහා ඉදිකර මෙහෙයුම් කර පවරා දීමේ පදනම යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ඉදිකර මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුම 2021.09.30 දින ක්‍රියාත්මක කරන ලද අතර එකී ගිවිසුම 2022.02.25 දින අත්සන් කරන ලදී.

2023.12.31 දිනට අත්කරගත් සුවිශේෂී සන්ධිස්ථාන ඇතුළුව ඉදිකිරීම් වල 39.5% ක් වන සමස්ත වත්මන් භෞතික ප්‍රගතියට ගොඩ කිරීම්, හෑරීම, සමුද්‍රීය කටයුතු, පසුපස අංගනය සහ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ඇතුළත් වේ.

### 3. බටහිර බහළු පර්යන්තය - II සඳහා දියකඩනය දීර්ඝ කිරීම

2019 ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුගතව, බටහිර බහළු පර්යන්තය - II ස්ථාපිත කිරීම සඳහා කොළඹ දකුණු වරායේ බටහිර දියකඩනය දීර්ඝ කිරීම ඉදිරි සංවර්ධන කාර්යයට ඇතුළත් වන අතර එමඟින් බටහිර බහළු පර්යන්තය I හි ජැටි බැම්ම දීර්ඝ කෙරෙනු ඇත.

බටහිර බහළු පර්යන්ත II පිටුපස අවම වශයෙන් හෙක්ටයාර 50 – 70 ක භූමිය ඇතුළත් වන ලෙස තවදුරටත් ගැඹුරු මුහුදේ බටහිර දෙසට දීර්ඝ කරමින් දැනට පවත්නා බටහිර දියකඩනය දීර්ඝ කිරීම බටහිර බහළු පර්යන්තයේ II ට ඇතුළත් වේ.

ප්‍රමාණවත් අධ්‍යයනයන් අවසන් කර ඇතත් ව්‍යාපෘතිය සංකල්පනාත්මක අදියරේ පවතී. එබැවින් ව්‍යාපෘතියේ විස්තීර්ණ සංවර්ධනය සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පවතී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව මෙම කාර්ය පිළිගත් වරාය සංවර්ධන උපදේශක සමාගමක් වෙත පවරනු ලැබේ. සවිස්තරාත්මක සැලැසුම් කාර්යයට ආසන්න වශයෙන් වසර දෙකක් ගතවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය ඇතිව මෙම අධ්‍යයනය සඳහා සුදුසු උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබා ගෙන ඇත. ප්‍රසම්පාදන ආයතනය එහි කාර්යභාරය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් යෝජනා සඳහා ඉල්ලීම් කිරීම සඳහා උපදේශකවරුන් කෙටි ලැයිස්තුගත කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර දැනට යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීමේ කටයුතු සිදු කරමින් සිටී.

### 4. කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශක සේවාව

නැව්බඩු ධාරිතාවයෙහි ප්‍රක්ෂේපිත වැඩි වීමට පිළියම් ලෙස නැගෙනහිර බහළු පර්යන්ත අදියර - II හා බටහිර බහළු පර්යන්ත - I ක්‍රියාත්මක කිරීමේ කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වර්තමානයේ ක්‍රියාත්මක කරමින් සිටී. මෙම පර්යන්ත දෙකෙහි ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු බටහිර බහළු පර්යන්ත - II, 2028 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වුවද, කොළඹ වරායට පැමිණෙනැයි පුරෝකථනය කර ඇති බහළු ධාරිතාවය මත පදනම්ව 2030 වර්ෂය වන විට සමස්ත වරාය බහළු ධාරිතාවයේ උපරිමයට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට ප්‍රතිචාර ලෙස දැනට පවත්නා කොළඹ වරායේ උතුරු දිශාවෙන් කොළඹ උතුරු වරාය ලෙසින් හඳුන්වන නව වරායක් ඉදිකිරීමේ කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආරම්භ කර ඇත.

යෝජිත කොළඹ උතුරු වරාය මෝදර ප්‍රදේශයේ කැළණි නදිය අසල සිට කොළඹ වරායේ පවත්නා උතුරු දියකඩනය තෙක් දීර්ඝ කිරීමට අපේක්ෂා කෙරේ. දියර තොග, වියළි තොග, රෝ රෝ සහ බහළු මෙහෙයුම් සඳහා උතුරු වරාය භාවිතා කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර ඇත. ඉල්ලුමට අනුගතව උතුරු වරායේ ඉදිකිරීම් කටයුතු අදියර වශයෙන් සිදු කරන අතර අපේක්ෂිත ඉල්ලුමට සරිලන යටිතල පහසුකම් සහ වරාය සේවාවන් ලබා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවී සිටී. මෙම කාර්යයෙහි වැදගත්කම හඳුනාගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් AECOM Infrastructure and Environment UK Limited සමාගම හරහා කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් දායකත්වයෙන් ප්‍රවාහන ව්‍යාපෘති ප්‍රාරම්භක පහසුකම් යටතේ මෙම උපදේශන කාර්ය සිදු කර ගෙන යනු ලැබේ.

AECOM සමාගම විසින් මෙහෙයවන ලද මෙම උපදේශක සේවාව මගින් ශක්‍යතා අධ්‍යයන වාර්තාව හා පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) වාර්තාව සාර්ථකව අවසන් කර ඇත. මෙම පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව මහජන අදහස් ලබා ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CC & CRMD) වෙත ඉදිරිපත් කර ඇති අතර මෙම ක්‍රියාවලියට පසුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘති කාර්යය සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුමට අනුගතව අවශ්‍ය යටිතල පහසුකම් හා වරාය සේවා නිසි කලට සැපයීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවධානයෙන් පසු වේ.

### 5. දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් මධ්‍යස්ථානය (SACLH)

දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය, එහි ඉදිකිරීම හා මෙහෙයුම් හා සම්බන්ධ ගිවිසුම් කොළඹ දී විධිමත් ලෙස අත්සන් කිරීමෙන් පසු කැපී පෙනෙන යටිතල පහසුකම් ව්‍යාපෘතියක් බවට පත් කිරීමට සැලසුම් කර ඇත. ආයෝජනය කරන ආයතන තුනෙහි එනම් චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් (CM Ports), ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) සහ ඇක්සස් ඉංජිනියරින් පීඑල්සී (Access) සමාගමේ නියෝජිතයින් වසර 50 ක් සඳහා ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුමකට ඇතුළත් වී ඇත.

වර්ග අඩි මිලියන 5 ක් සහ ඝන මීටර් 530,000 ක සැලසුම් කළ ගබඩා ධාරිතාවයක් ආවරණය වන මහල් අටකින් යුත් දර්ශනීය ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මෙම අභිලාෂීය කාර්යභාරය දකුණු ආසියාවේ විශාලතම වාණිජ හා සේවා සැපයුම් සංකීර්ණය ලෙස පිළිගැනීමට ලක්වනු ඇත.

මෙම සුවිශේෂී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා මග හසර තනමින් 2023 ජූලි මස දී වැඩබිම් කල්බදු ගිවිසුම අත්සන් කිරීමේ ඉතා වැදගත් පියවර සාර්ථකව අවසන් කරන ලදී.

### 6. වරාය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීම

ගිනි නිවීමේ අංශයේ සිට සමර්හිල් දක්වා මාර්ගය ආවරණය කරමින් ප්‍රධාන අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල් කිරීමේ ඉදිකිරීම් කටයුතු 2023 වසරේ දී සාර්ථකව අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් මසදී ආරම්භ කළ අතර ඉදිකිරීම් වැඩ සඳහා රුපියල් මිලියන 175.6 ක සත්‍ය පිරිවැයක් දරණ ලදී.

ජය බහළු පර්යන්තයේ බහළු අංගනයේ අභ්‍යන්තර මාර්ගවල අදියර II හි මතුපිට තාර දමා පිළිසකර කිරීමේ කටයුතු 2022 දෙසැම්බර් මාසයේ දී ආරම්භ වූ අතර 2023 ඔක්තෝම්බර් මාසයේදී රුපියල් මිලියන 289.3 ක වියදමක් දරා අවසන් කරන ලදී. මීට අමතරව, විජය කුමාර ජැටියේ අදියර II හි අංගනයේ ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු රුපියල් මිලියන 291 ක මූලික පිරිවැයකට 2023 නොවැම්බර් මසදී ආරම්භ කරන ලද අතර ඉදිකිරීම් කටයුතු 2024 ජූනි මාසයේදී අවසන් කිරීමට අපේක්ෂිතය.

### 7. ජය බහළු පර්යන්ත - IV ජැටි බැම්ම දීර්ඝ කිරීම

ජය බහළු පර්යන්ත - IV හි පවතින ජැටි බැම්ම අවම අද්දර ගැඹුර මීටර් 16 (පහළ මට්ටමේ සාමාන්‍ය උදම් රළ) සහිතව මීටර් 120 කින් දීර්ඝ කිරීම සඳහා 2017 වර්ෂයේදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කරන ලදී. මීටර් 330 කට වඩා වැඩි දිගින් යුත් නෞකා දෙකකට එකවර නැංගුරම් පහසුකම් සැලසීමට හැකි වීම පිණිස වරාය ධාරිතාවය පුළුල් කිරීම මෙහි අරමුණ විය.

කෙසේ වුවද, සංවර්ධන කොන්ත්‍රාත්තුවේ සිවිල් වැඩ සංරචකය 2018 දී බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනයෙන් තොර වූ කරුණු හේතුකොට ගෙන එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදනයන්ට මුහුණ පෑමට සිදු විය.

ඉන්අනතුරුව, කොන්ත්‍රාත්කරු සමඟ නැවත සාකච්ඡා කර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, 2020 නොවැම්බර් මාසයේදී ඉදිකිරීම් ආරම්භ කර, පවතින ප්‍රගතියත් සමඟ 2023 වසර තුළ ක්‍රියාත්මක කෙරින.

### 8. වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් සේවා ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විවිධ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. පහත දැක්වෙන කාර්යයන් එම ව්‍යාපෘතිවලට ඇතුළත් වේ.

#### 8.1 පහසුකම් සැලැසීම හා සම්බන්ධීකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ගයේ කොන්ත්‍රාත්කරු සමඟ පහසුකම් සැපයීමේ හා සම්බන්ධීකරණය පැවැත්වීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටී.

#### 8.2 වැඩහල් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතුකොටගෙන, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩහල් ගොඩනැගිලි ප්‍රතිස්ථානගත කළ යුතුව ඇත. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍ය පහසුකම් සලසනු ලබන ගොඩනැගිලි හතරකින් සමන්විත වැඩහල් සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2,089 ක ඇස්තමේන්තුවක් (මිල උච්චාවචනය සැලකිල්ලට ගෙන) සකස් කර ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව 2021.09.09 දින BEL-DGES JV සමාගම වෙත ප්‍රදානය කරන ලදී. ඉදිකිරීම් 2023 දෙසැම්බර් මාසයේ නිමවූ අතර, අළුත් වැඩහල් ගොඩනැගිල්ල 2024 ආරම්භයේදී විවෘත කිරීමට නියමිතය.

#### 8.3 සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල)

වරාය ප්‍රවේශය අධිවේගී ගුවන් මාර්ගය හේතුකොටගෙන ප්‍රතිස්ථානගත කරන කාර්යාල ගොඩනැගිලිවල කාර්යමණ්ඩලය සඳහා කැනල් යාඩ් අංගන පරිශ්‍රයේ මහල් 17 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කෙරෙමින් පවතී. රුපියල් මිලියන 6,200 ක පිරිවැයකින් ඉදිවන මෙම ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්රියාත්මක කරනු ලැබේ. අදාළ මූල්‍ය යෙදවුම ආසියානු සංවර්ධන බැංකුව මගිනි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘති සම්බන්ධීකරණය කාර්යයෙහි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි අවශ්‍යතා පදනම්ව එහි ව්‍යාපෘතිය නිම කිරීමේ කටයුතු වල ක්‍රියාකාරීව නිරතව සිටී. 2023 වර්ෂය

අවසානය වන විට ව්‍යාපෘතියෙන් 38.1% ක ප්‍රගතියක් අත්කර ඇත. ව්‍යාපෘතියේ අපේක්ෂිත අවසන් කිරීමේ දිනය 2024 දෙසැම්බර් මාසය වේ.

### 8.4 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම.

ගෘහ භාණ්ඩ අවශ්‍යතා කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු හා අභ්‍යන්තර නිර්මාණ ශිල්පියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම හා කාර්යාල පරිශ්‍රවල දැනට පවතින භාණ්ඩ ගෘහ නිර්මාණ ශිල්පියාගේ හා අභ්‍යන්තර නිර්මාණකරුගේ උපදෙස් සහිතව නවීකරණය කිරීම මෙම සැලසුමට අයත් වේ.

## 9. ත්‍රිකුණාමලය වරායේ වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම

ත්‍රිකුණාමලය වරායේ වාසිදායක පිහිටීම, ගැඹුරු වරාය යටිතල පහසුකම් සහ කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය වරාය ආශ්‍රිත පුළුල් ප්‍රදේශය භාවිතයට ගනිමින් එම ප්‍රදේශයේ ආර්ථික කටයුතුවල ප්‍රමුඛ ක්‍රියාකරුවෙකු බවට ත්‍රිකුණාමලය වරාය පරිවර්තනය කිරීම උපාය මාර්ගික උත්සාහයකි. අධිවේගී මාර්ග ජාලය පුළුල් කිරීම හරහා භූමිය මතින් කොළඹ වරායට ඇති අඛණ්ඩ සම්බන්ධතාවය මෙම වරායේ විභව්‍යතාව තවදුරටත් පුළුල් කරනු ලැබේ.

ජාතික වරාය ප්‍රධාන සැලැස්ම මගින් මෙන්ම ත්‍රිකුණාමලය කලාප සැලැස්ම මගින් ද දුම්රිය මාර්ග හා මහා මාර්ග අතර පවතින විභව්‍ය සම්බන්ධතාවය සැලකිල්ලට ගනිමින් කර්මාන්ත සංවර්ධනය සඳහා කේන්ද්‍රස්ථානයක් බවට ත්‍රිකුණාමලය වරාය පරිවර්තනය කිරීම සඳහා ඇති හැකියාව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා රජයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමූහික අරමුණ වනුයේ කර්මාන්ත ආශ්‍රිත ව්‍යාපාර සහ සංචාරක කටයුතු සඳහා ත්‍රිකුණාමලය වරාය ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් බවට පත් කිරීම වේ.

මෙම සංවර්ධන කාර්යයේ තිරසරභාවය තහවුරු කිරීම සඳහා පරිසර හිතකාමී සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු කරමින් මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගිතාවය ඇතිව ක්‍රමෝපායික පාරිසරික තක්සේරුවක් මේ වන විට පිළියෙල කෙරෙමින් පවතී.

## 10. ත්‍රිකුණාමලය වරායේ සංවර්ධන කටයුතු

ත්‍රිකුණාමලය වරායේ මහල් තුනකින් යුත් ඉංජිනේරු වැඩබිම් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රුපියල් මිලියන 327 ක මූලික පිරිවැයකට 2023 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද අතර 2024 ජූනි මාසයේදී අවසන් කිරීමට නියමිතය. තවද, අභ්‍යන්තර හා නෞකාවල ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් ත්‍රිකුණාමලය වරායේ දැනට පවත්නා ජල ටැංකිය සඳහා පොම්පය ස්ථාපිත කිරීමේ හා නල පද්ධතිය එළීමේ කටයුතු 2023 නොවැම්බර් මසදී ආරම්භ කරන ලද අතර 2024 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

## 11. ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ගාල්ල වරාය සංචාරක කටයුතු හා ප්‍රාදේශීය වාණිජ කටයුතු යන කාර්ය දෙඅංශය සඳහාම පහසුකම් සපයන බහු කාර්ය කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කිරීම ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම සැලසුම්ගත සංවර්ධනය මගින් තිරසර සාම්ප්‍රදායික වරාය සේවා අභිබවමින් ලබා දීමට පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගත හැකි තිරසර ආදර්ශකයක් ඇති කිරීමට හැකි වේ. ගාල්ල බොක්කේ උපාය මාර්ගික භූගෝලීය පිහිටීමේ වාසිදායක තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විවේකය ගත කිරීම සඳහා සහ දේපොළ සංවර්ධනය සඳහා අවස්ථා නිර්මාණය කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ.

ගැඹුරු මගී පර්යන්තයක්, එකිනෙක සම්බන්ධ වූ රුඳවුම් බැම්මක්, දියකඩන ඉදිකිරීම, පිවිසුම් ඇළ මාර්ගය සහ වරාය ද්‍රෝණිය හෑරීම මෙන්ම ඉඩම් ගොඩකර සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. වාණිජ හා විනෝදාස්වාදය ගෙන දෙන පහසුකම් මිශ්‍රණයක් හරහා ආර්ථික වර්ධනය අපේක්ෂා කරමින් ගොඩකර සංවර්ධනය කරන ඉඩම් මිශ්‍ර සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනෙනු ඇත. ගාල්ල ප්‍රදේශයේ මෙන්ම සමස්ත රටෙහි ආර්ථික සංවර්ධනයට සමාන්තරව ප්‍රතිලාභ අත්කර ගැනීමේ ඉලක්කයට මෙම විස්තීර්ණ සැලැස්ම අනුගත වේ.

ඒ අනුව, ප්‍රසම්පාදන කාර්ය ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම පරිණාමනීය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජකයෙකු තොරා ගැනීම සඳහා අභිලාෂීය ප්‍රකාශ කිරීම හා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම 2024 වසරේ දී සිදු කිරීමට නියමිතය.

## 12. කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම

ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් ඇ.එ.ජ.ඩොලර් මිලියන 45 ක් යොදවමින් කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ අරමුණ කන්කසන්තුරය වරාය වාණිජ වරායක් බවට පරිවර්තනය කිරීම වන අතර, මෙම ව්‍යාපෘතිය, දියකඩනය හා පලම් අළුත්වැඩියා කිරීම, අළුතින් වාණිජ නැංගුරම්පොළක් ඉදිකිරීම සහ අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන කාර්යයන්ගෙන් සමන්විත වේ.

ව්‍යාපෘතියේ සැලසුම් නිර්මාණ හා උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ව්‍යාපෘති කළමනාකරණ උපදේශක සේවා ගිවිසුමකට එළඹෙන ලද අතර ගිවිසුමෙහි කාර්යයන් 2020.10.12 දින ආරම්භ කරන ලදී. ලික උපදේශක අදියරෙහි කාර්යයන් මේ වන විට 72% කින් සම්පූර්ණ වී ඇත. දැනට උපදේශක සමාගම වෙත රුපියල් මිලියන 196 ක් මේ වන විට ගෙවා ඇත.

## 13. කන්කසන්තුරය සහ ඉන්දියාව අතර අත්හදා බැලීමේ පදනමින් මගී යාත්‍රා සේවයක් ආරම්භ කිරීම

ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියර 2024 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව ඇත. කෙසේ වුවද, ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට ප්‍රථමයෙන් පූර්ව සුදුසුකම් ලේඛනය සඳහා සහ ණය ලබා ගැනීම සඳහා ඉන්දියාවේ එක්සිම් බැංකුවෙහි අනුමැතිය ලබාගත යුතුව ඇත.

යාත්‍රා සේවය සඳහා මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මුළුමනින්ම අවසන් කරන ලද අතර එය ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2023.06.16 දින විවෘත කරන ලදී.

අළුතින් ඉදි කරන ලද ගොඩනැගිල්ල බිම් සේවා බාහිරින් ලබා ගනිමින් කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණය කර ඇත. මෙම මෙහෙයුම් ක්‍රියාවලියෙහි ප්‍රතිඵලදායකත්වය මත මෙම ක්‍රියා පිළිවෙත ඉදිරියට කර ගෙන යනවාද නැද්ද යන බව තීරණය වනු ඇත. මෙය සාර්ථක වන්නේ නම් සහ අපේක්ෂිත ප්‍රතිචාර ලැබෙන්නේනම්, අනාගතයේදී මගී යාත්‍රා සහ සංචාරක නැව් වඩා විශාල පරිමාණයෙන් මෙහෙයුම් කිරීම අරමුණු කරමින් කන්කසන්තුරය වරායේ මගී පර්යන්තය මෙහෙයුම් කිරීම සඳහා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවනු ඇත. දැනට, මෑතදී සම්පූර්ණ කරන ලද පර්යන්ත ගොඩනැගිල්ල භාවිතා කරමින් මගී යාත්‍රා මෙහෙයුම් සතුටුදායක ලෙස ක්‍රියාත්මකව පවතී.

## 14. ඔලුවිල් වරාය සඳහා ආයෝජන අවස්ථාවන්

ඔලුවිල් වරායේ ආයෝජනය කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම් සහ යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමෙහි ක්‍රියාවලිය සඳහා 2022.11.22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. වරාය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය සහිතව, ඔලුවිල් වරායේ වාණිජ වරාය ඇතුළත දිගු කාලීන කල්බදු සඳහා ඉඩම් හා ගොඩනැගිලි සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම සඳහා තක්සේරු කිරීමට විශේෂ ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් පත් කර ඇත.

අභිලාෂය ප්‍රකාශ කිරීමේ අදියරට අනුව, යෝජනා සඳහා ඉල්ලීම් අදියරේදී ඉදිරියට ගෙනයාහැකි බවට විශේෂ ව්‍යාපෘති ඇගයීම් කමිටුව තීරණය කළ, ආයෝජකයින් තුන්දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද මූලික යෝජනා තුනක් තිබිණ. අභිලාෂය ප්‍රකාශ කිරීමේ අදියර තුළදී සාර්ථකව යෝජනා ඉදිරිපත් කළ ආයෝජකයින් තුන්දෙනා වෙත 2023 දෙසැම්බර් මාසයේදී යෝජනා සඳහා ඉල්ලීම් නිල වශයෙන් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනා 2024 ජනවාරි මාසයේදී ඇගයීමට ලක් කිරීමට නියමිතව ඇති අතර එහිදී ඔලුවිල් වරායේ වාණිජ වරාය පරිශ්‍රය තුළ වරාය ආශ්‍රිත කර්මාන්ත සඳහා ඉඩම් කල්බදු දීමට සුදුසු ආයෝජකයින් තෝරා ගැනීමට හැකිවනු ඇත.

මෙම පරිවර්තනීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළ, සිය ක්‍රමෝපායික පිහිටීම තුළින් ගෝලීය සමුද්‍රීය හා සේවා සැපයුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් බවට පත් වීමට ශ්‍රී ලංකාව දරණ කැපවීම යළි තහවුරු වන සුවිශේෂී ප්‍රගතියක් සහිත කාල පරිච්ඡේදයක් 2023 වර්ෂය මගින් පිළිබිඹු වේ.

### 8.2.4. 2023 වසරේ මූල්‍ය කාර්යසාධනය

| විස්තරය | 2023<br>රු. මිලියන |
|---|---:|
| ආදායම | |
| මෙහෙයුම් ආදායම | 63,261.17 |
| වෙනත් ආදායම් | 29,559.92 |
| **මුළු ආදායම** | **92,821.09** |
| වියදම | |
| සේවක වේතන | 19,832.80 |
| අතිකාල | 6,319.95 |
| ඉන්ධන, විදුලිය සහ වෙනත් ලිහිසි ද්‍රව්‍ය | 6,522.39 |
| වත්කම් නඩත්තු කිරීම | 2,878.78 |
| වෙනත් වියදම් (බාහිර කුලී ගාස්තු, ගමන් වියදම් ආදිය) | 11,384.87 |
| **උප එකතුව** | **46,938.78** |
| **විදේශ ණය පොළිය සහ විදේශ විනිමය (පාඩු)/ ලැබීම් වලට පෙර ලාභ /(පාඩු)** | **45,882.31** |
| විදේශ ණය පොළිය | 4,217.89 |
| **විදේශ විනිමය (පාඩු)/ලැබීම් වලට පෙර සහ විදේශ ණය පොළියට පසු ලාභ/ (පාඩු)** | **41,664.41** |
| විදේශ විනිමය (පාඩු)/ලැබීම් | (1,305.17) |
| **විදේශ විනිමය (පාඩු)/ලැබීම් සහ විදේශ ණය පොළියට පසු සහ බදු වලට පෙර ලාභ/ (පාඩු)** | **40,359.24** |
| **ඒකාබද්ධ අරමුදලට දායකත්වය** | (8,673.69) |
| **ආදායම් බදු වියදම්** | (5,564.71) |
| **විලම්බිත බදු** | (6,180.78) |
| **වසර තුළ ලාභය** | **19,940.07** |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම නැවත ගණනය කිරීම | 4,930.56 |
| ලැයිස්තුගත ආයෝජන මත වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් වල අගය වෙනස් වීම | (18.58) |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් වල අගය වෙනස් වීම | 4,928.24 |
| වසර තුළ වෙනත් මුළු විස්තීර්ණ ආදායම | **29,780.29** |

## 8.3 සී/ ස ලංකා නැව් සංස්ථාව

### 8.3.1 හැඳින්වීම

සී/ස ලංකා නැව් සංස්ථාව, ජාතික මුහුදු ප්‍රවාහකයා වශයෙන් නැව් සේවා සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් ජාතික ආර්ථික වර්ධනයට සහාය වෙමින් රටේ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද මහගු සේවයක් සිදු කරයි. තවද නැව් අත්පත් කර ගැනීම, නැව් කුලියට ගැනීම හා කුලියට දීම, නැව් කළමනාකරණය, තැරව්කාර කටයුතු, භාණ්ඩ නැව්ගත කිරීම් සහ නැව් නියෝජිත ජාලය පවත්වාගෙන යාම, සී/ස ලංකා නැව් සංස්ථාව මගින් සිදු කරනු ලැබේ.

**දැක්ම**

කලාපීය නාවික මධ්‍යස්ථානයක් ලෙස දියුණුවෙමින් පවතින ශ්‍රී ලංකාවෙහි කාර්යක්ෂම හා වඩාත් ඵලදායි ජාතික නාවික පද්ධතියක් ස්ථාපනය කිරීම හා නාවික ප්‍රවාහන සේවා පහසුකම් සංවර්ධනය කිරීම.

**මෙහෙවර**

ජාතික ප්‍රවාහන සේවය මෙහෙවර වශයෙන් ශ්‍රී ලංකාවේ ආනයන, අපනයන හා දේශීය වෙරළාශ්‍රිත ප්‍රවාහන කාර්යයෙහිලා පහසුකම් සැපයීම හා එයට අවශ්‍ය සහයෝගය ලබාදීම. ලාංකික නාවිකයන් සඳහා නාවික පුහුණු අවස්ථා සපයමින්, ක්ෂේත්‍රය සඳහා ප්‍රවීණ නිළධාරීන් පිරිසක් බිහි කිරීම. විවේක උත්පාදන සේවාවන් සැපයීම සඳහා ඉන්දියන් සාගරයේ මගී ප්‍රවාහන නෞකා කටයුතු (Cruise Liner Passenger Ferry activities) හැසිරවීමේ පාර්ශවකරුවකු වශයෙන් කටයුතු කිරීම.

**ප්‍රධාන අරමුණු**

**වෙළඳ ක්ෂේත්‍රය හා පාරිභෝගිකයන් උදෙසා**

- ජාතික ආර්ථික වර්ධනයට උරදෙමින් රටෙහි ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කිරීම.
- කෙටි කාලයක් තුල අවම මිල ගණන් යටතේ උපරිම පාරිභෝගික විශ්වාසය රකිමින් පාරිභෝගික අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

**රට හා සමාජයා උදෙසා**

- අනාගත ජාතික සංවර්ධන ක්‍රියාවලියෙහිදී නාවික මධ්‍යස්ථානයක් වශයෙන් රටෙහි සංවර්ධනයට උරදීම.
- පාරිභෝගික අවශ්‍යතාවය හඳුනාගනිමින් තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආනයන ක්‍රියාවලියේදී නැව් ගාස්තු මෙරටදී ගෙවීම තුලින් (FOB Basis) විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීමට දායකවීම.
- රටෙහි තාප බල ශක්ති උත්පාදන අංශයෙහි නාවික සැපයුම් හා ප්‍රවාහන සහකරුවෙකු වශයෙන් දිගටම ක්‍රියාකිරීම.
- රටෙහි බලශක්ති/ඛණිජ තෙල් සැපයුම් කාර්යයෙහි නාවික සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම.

**හිමිකාරිත්වය උදෙසා**

- ලාභය උපරිම කරමින් විදේශ විනිමය රටට ඉතිරි කර ගැනීම තුළින්, රාජ්‍ය භාණ්ඩාගාරයට ඉහළම දායකත්වයක් සැපයීම.

### 8.3.2. ප්‍රධාන කාර්යයන්

- නැව් හිමිකාරිත්වය, නැව් කළමනාකරණය, නැව් කුලියට ගැනීම හා තැරැව් කිරීම.
- මුහුදු මාර්ගයෙන් නැව් භාණ්ඩ ප්‍රවාහනය.
- භාණ්ඩ හා සේවා සම්පාදන කටයුතු (logistics) හා රේගු නිෂ්කාශන සේවා (අපනයන හා ආනයන).
- නැව් නියෝජිත සේවා (Agency Services).
- නාවික තැරැව්කාර සේවා (Brokering).
- නැව් කුලියට ගැනීම හා කුලියට දීම.

- පුත්තලම තාප විදුලි බලාගාරය සඳහා නාවික යාත්‍රා මගින් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා නාවික පුහුණුව ලබාදීම.

### 8.3.3. 2023 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දක්වා කාලය සඳහා සී/ස ලංකා නැව් සංස්ථා සමස්ත මූල්‍ය ප්‍රගතිය

ලාභ/ අලාභ ප්‍රකාශය

| | 2023/24 (රු. මිලියන) | 2022/23 (රු. මිලියන) |
|---|---|---|
| ආදායම | 3,644.49 | 6,649.45 |
| සෘජු මෙහෙයුම් වියදම් | (2,171.20) | (3,253.91) |
| දළ ලාභය | 1,473.29 | 3,395.54 |
| වෙනත් ආදායම් | 279.03 | 835.58 |
| පරිපාලන වියදම් | (229.24) | (246.34) |
| මෙහෙයුම් ලාභය (වත්කම් අඩුවීම් වලට පෙර) | 1,523.08 | 3,984.78 |
| ❖ වත්කම් අඩුවීම් | - | (84.10) |
| මෙහෙයුම් ලාභය (මූල්‍ය වියදම් වලට පෙර ) | 1,523.08 | 3,900.68 |
| මූල්‍ය වියදම් | | |
| මහජන බැංකු ණය පොළී | (1,829.83) | (1,569.95) |
| විනිමය අලාභය (Exchange Loss) | (70.89) | (2,811.89) |
| විනිමය අනුපාතය පහළ යාම නිසා ඇතිවූ ලාභය (Exchange Gain- Vessel Loan (Norman Entry)) | 1,576.30 | - |
| ➢ ආශ්‍රිතයන්ගේ ලාභයේ කොටස (ශුද්ධ බදු) Share of Profit of Associates (Net of tax) | - | 47.55 |
| බදුවලට පෙර ලාභය / (අලාභය) | 1,198.66 | (433.61) |

වගුව I

**මූලාශ්‍රය: කෙටුම්පත් ගිණුම් 2023/24 සහ විගණිත ගිණුම් 2022/23**

❖ 2023/24 වසර සඳහා වත්කම් අබලතා ගිණුම්ගත කර නොමැත.

ඉහත I වගුවට අනුව, 2022/23 වසරට සාපේක්ෂව 2023/24 වසරෙහි ආදායම 45% කින් අඩු වී ඇත. එමෙන්ම, සෘජු මෙහෙයුම් වියදම් 33% කින් අඩු වී ඇති අතර පරිපාලන වියදම් 7% කින් අඩුවී ඇත.

තවද, 2022/23 වසරට සාපේක්ෂව 2023/24 වසර තුළ මූල්‍ය වියදම්වලට පෙර මෙහෙයුම් ලාභය 61% ක අඩු වීමක් පෙන්වයි.

2023/24 වර්ෂයේදී, මහජන බැංකු ණය පොළී සහ විනිමය අලාභය ඇතුළු මූල්‍ය වියදම් ගණනය කිරීමෙන් අනතුරුව ලැබෙන අවසාන අගය, රු. මි. 1,198.66 ක ලාභයක් (බදු පෙර ලාභය) ලෙස පෙන්නුම් කරයි. නමුත් 2022/23 වර්ෂය තුළ එම අගය රු. මි. 433.61 ක අලාභයක් ලෙස සටහන් වී ඇත. තවද, 2023/24 වසරෙහි මූල්‍ය වියදම්වලද 57% ක අඩුවීමක් දැකිය හැක.

සී/ස ලංකා නැව් සංස්ථා නෞකාවල ශිෂ්‍ය භට පුහුණුව

➢ පුහුණු කරන ලද මුළු ශිෂ්‍ය භටයින් 2023/24 (01.04.2023 – 31.03.2024)

| තනතුර | සිලෝන් ප්‍රින්සස් | සිලෝන් බ්‍රීස් |
|---|---|---|
| නාවික ශිෂ්‍යභට | 02 | 19 |
| ඉංජිනේරු ශිෂ්‍යභට | 14 | 07 |
| විදුලි ශිෂ්‍යභට | 02 | - |
| Ordinary Seaman (OS) | 23 | 04 |
| මුළු ගණන | 41 | 30 |

➢ දැනට නැව් දෙකෙහි නියුතු ශිෂ්‍ය භටයින්

| තනතුර | සිලෝන් ප්‍රින්සස් | සිලෝන් බ්‍රීස් |
|---|---|---|
| නාවික ශිෂ්‍යභට | - | 18 |
| ඉංජිනේරු ශිෂ්‍යභට | 05 | 01 |
| විදුලි ශිෂ්‍යභට | 02 | 02 |
| Ordinary Seaman (OS) | 16 | 03 |
| මුළු ගණන | 23 | 24 |

වගුව II

මූලාශ්‍රය - CSC තාක්ෂණික දෙපාර්තමේන්තුව

## 8.4. ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Ltd)

### 8.4.1. හැඳින්වීම

කොළඹ තෙල් බැංකුව ලෙසින් ද හඳුන්වනු ලබන, ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Limited), ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගමක් වන අතර, එය කලාපය තුළ ප්‍රමුඛ නාවික ඉන්ධන ගබඩා කරවීමේ පහසුකම් ඇති පර්යන්තය ද වේ. මෙම සමාගමේ ප්‍රධාන කාර්යය වන්නේ එකී තෙල් බැංකුව කළමනාකරණය කර පාලනය කිරීම වන අතර, එය ආනයනය කළ ඉන්ධන ගබඩා කිරීම සඳහා ඉන්ධන සැපයීමේ බලපත්‍රලාභීන් (BLHs) වෙත පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා රේගුවේ අනුමත බන්ධිත ගුදමක් ලෙස ස්ථාපිත කරන ලදී.

**දැක්ම**

ආසියානු කලාපයේ ඉන්ධන පිරවීමේ කේන්ද්‍රය බවට පත්වීම.

**මෙහෙවර**

ඉන්ධන පිරවීමේ බලපත්‍රලාභීන් වෙත යටිතල ගබඩා පහසුකම් සංවර්ධනය කරමින් රටේ වටිනාකම උපරිම කිරීම.

8.4.2 මෙහෙයුම් කාර්යසාධනය

2023 වසර තුළ මුළු පිරවීම් සහ ගොඩබෑම්

| නිෂ්පාදනය | පැටවීම | | ගොඩබෑම | |
|---|---|---|---|---|
| | මෙට්‍රික් ටොන් | % | මෙට්‍රික් ටොන් | % |
| LSFO 380Cst | 337,123.447 | 81.75% | 344,736.166 | 82.04% |
| MGO | 75,243.343 | 18.25% | 75,449.809 | 17.96% |
| එකතුව | **412,366.790** | | **420,185.975** | |

8.4.3 මූල්‍ය කාර්යසාධනය

2022 වසර සහ 2023 වසරේ ප්‍රධාන මූල්‍ය දත්තවල සන්සන්දනය පහත වගුවේ පෙන්නුම් කරයි.

| | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| **ආදායම** | **612,328,282.00** | **608,028,143.00** |
| විකුණුම් පිරිවැය | (227,570,735.00) | (192,182,027.00) |
| **දළ ලාභය** | **384,757,547.00** | **415,846,116.00** |
| පරිපාලන වියදම් | (143,834,475.00) | (126,459,095.00) |
| **මෙහෙයුම් ලාභය/(අලාභය)** | **240,923,072.00** | **289,387,021.00** |
| මෙහෙයුම් නොවන ආදායම | 1,558,899.00 | 291,561.00 |
| මූල්‍ය ආදායම | 122,246,510.00 | 49,481,953.00 |
| මූල්‍ය පිරිවැය | (12,534,472.00) | (14,033,063.00) |
| **බදු පෙර ලාභය** | **352,194,009.00** | **325,127,474.00** |
| ආදායම් බදු වියදම | (108,318,836.00) | (79,515,958.00) |
| **වසර සඳහා ලාභය** | **243,875,173.00** | **245,611,516.00** |
| කොටසක ඉපයීම් | 2,438.75 | 2,456.12 |

**8.4.4 JCT Ltd හී සංවර්ධන ව්‍යාපෘති**

- මෙට්‍රික් ටොන් 12000 ක ධාරිතාවයකින් යුත් ඉන්ධන ගබඩා ටැංකි දෙකක් ඉදිකිරීම.
- JCT සමාගම සඳහා බවුසර් පැටවුම් යන්ත්‍රයක් සැපයීම.
- කොළඹ වරායේ NNP ජැටියේ සිට UCT ජැටිය දක්වා ඉන්ධන පොම්ප මාර්ග 03ක් එලීම.
- නාවික ගෑස් ඉන්ධන (MGO) සඳහා එංජිමෙන් ක්‍රියාත්මක පොම්ප ඒකකයක් ස්ථාපිත කිරීම.

## 8.5 ශ්‍රී ලංකා වරාය කළමනාකරන හා උපදේශක සේවා (පුද්ගලික)සමගම

### 8.5.1 හැඳින්වීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිය ප්‍රධාන ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කිරීමට හැකිවන පරිදි කොළඹ වරාය තුළ වරාය ආශ්‍රිත ඕනෑම උපකාරක සේවාවක් සැපයීමේ අරමුණින් 1982 දී සමාගම ආරම්භ කරන ලද ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර ඇති රජයා සතු සීමිත වගකීම් සහිත සමාගමකි.

**දැක්ම**
"වඩාත් කැමති ආධාරක වරාය සේවා සපයන්නා වන්න"

**මෙහෙවර**
"අපගේ සියලුම පාර්ශවකරුවන්ට ලෝක මට්ටමේ සේවාවක් සැපයීම"

### 8.5.2 සේවාවන්

- නැගෙනහිර බහළුම් පර්යන්තය සඳහා පර්යන්ත ක්‍රියාකරුවන් සැපයීම.
- අන්තර් පර්යන්ත බහළුම් ප්‍රවාහන සේවය
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් ගාලු මුවදොර පිටියේ කළමනාකරණය/පරිපාලනය
- ජයා බහළුම් පර්යන්තයේ රීෆර් (ශීතකරණ සහිත) බහළුම් උෂ්ණත්වය නිරීක්ෂණය කිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ඉවතලන අයිතම ඉවත් කිරීම.
- කොළඹ වරායේ සනීපාරක්ෂක පහසුකම් සැපයීම.

## 8.6 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

### 8.6.1 හැඳින්වීම

ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව, 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ දේශීය සිවිල් ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූලික කාර්යභාරය වේ.

**දැක්ම**
"සැමට නිරුපද්‍රිත අහසක් සහතික කරමින් ප්‍රවීණ හා විශ්වසනීය ගුවන්සේවා නිරුපද්‍රිත නියාමකයෙකු බවට පත් වීම."

**මෙහෙවර**
"උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මඟින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමඟත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමඟත් අනුගත නිරුපද්‍රිත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම."

### 8.6.2 ප්‍රධාන කාර්යභාරය

- දිවයිනේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සැලසුම් කිරීමේදී ගරු සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයාගේ සහ අනෙකුත් රජයේ පාර්ශ්වකරුවන්ගේ අදහස් පිළිබිඹු වන බව සහතික කිරීම සඳහා ඔවුන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම.

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක සැකසීම සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානාත්මක කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට ඇතුළත් කර ඇති රජයේ අරමුණු පිළිබිඹු කිරීම සඳහා අදාළ වන පරිදි ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම.

- නිල බලයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම පැවරීම.

- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමට හැකිවන පරිදි සුදුසුකම්ලත් නිපුණ පුද්ගලයින් සේවයේ යොදවා ගැනීම සහ ඔවුන්ගේ සේවා නියම සහ කොන්දේසි නිර්ණය කිරීම.

- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පවත්නා සැලසුම් සහ ප්‍රගතිය පිළිබඳව සිවිල් ගුවන් සේවා විෂය භාර ගරු අමාත්‍යවරයාට වගකිව යුතුවීම.

### 8.6.3 අනාගත සංවර්ධනය

- ගුවන්සේවා කර්මාන්තය ඔස්සේ ජාතික ආර්ථිකයට සවියක් සැපයීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක වන රජයේ වැඩපිළිවෙලට සවියක් වෙමින් මත්තල සහ යාපනය ගුවන්තොටුපොලවල් නවීකරණය කරමින් කර්මාන්ත කරුවන් හට විවිධ පැතිකඩ ඔස්සේ ආයෝජන අවස්ථාවන් උදාකරලීම වෙනුවෙන් කටයුතු සිදුකරනු ඇත. මේ වන විට කැබිනට් අනුමැතිය හිමිවී ඇති හිඟුරක්ගොඩ ගුවන්තොටුපොල සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය නියාමන මගපෙන්වීම් සිදුකිරීම ද ප්‍රමුඛ කාර්යයකි. එමෙන්ම වත්මන් සංචාරක ක්ෂේත්‍රයේ පිබිදීම හමුවේ ඒ වෙනුවෙන් දේශීය ගුවන් කර්මාන්තය උපයෝගී කරගැනීම වෙනුවෙන් ද බෙහෝ කටයුතු සම්පාදනය වනු ඇත.
- දැනට පවතින සේවක පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කර ගනිමින් ආයතන කාර්යක්ෂමතාව ඉහල නංවා ගැනීම.
- වීරවිල හා මඩකලපු සංචාරක බංගලා අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ඔස්සේ අධිකාරියේ නිලධාරීන්ට මෙන්ම මෙම කර්මාන්තයේ නිරත හෝ වෙනත් බාහිර පාර්ශවයන්ටද ලබා දෙමින් නව ආදායම් මාර්ග උත්පාදනය කර ගැනීම.
- ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශන සඳහා ස්වාධීන ආයතනයක් ස්ථාපනය කිරීම - ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියට (චිකාගෝ සම්මුතිය) අත්සන් තබා ඇති රාජ්‍යයක් වශයෙන් විමර්ශනයක් පැවැත්වීමට හා විමර්ශනයේ විෂය මූලිකත්වයට බාධා සිදු කළ හැකි රාජ්‍ය ගුවන් සේවා අධිකාරියෙන් සහ වෙනත් ආයතනවලින් ස්වාධීනව පවතින අනතුරු විමර්ශන අධිකාරියක් ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකාවට බැඳීමක් ඇත. එබැවින්, මෙම අධිකාරිය විසින් ස්වාධීන ආයතනයක් ස්ථාපනය කිරීමට යෝජනා කර ඇත. ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශ (AAIB) පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් කෙටුම්පත් කර ඇති අතර එහි අවසාන කෙටුම්පතට අදාල CAASL නිරීක්ෂණ නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත.
- මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය අපරානුමත කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලැබුණු අතර ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් පළමු කෙටුම්පත් CAASL නිරීක්ෂණ සඳහා යොමු කර ඇත.
- 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනත සහ 2010 අංක 14 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනත රජයේ ප්‍රතිපත්ති සහ කර්මාන්තයේ අවශ්‍යතා අනුව සංශෝධනය කෙරේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,

ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන පිළිබඳ යෝජනාවලට අදාළ කටයුතු අවසන් කර රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

- නිරුපද්‍රතතා ප්‍රමිති වැඩි දියුණු කිරීම සඳහා විශේෂ ඒකකයක් ස්ථාපනය කිරීම - ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාවල නිරුපද්‍රතතාව සහ සුරක්ෂිතතාව පිළිබඳ අධීක්ෂණ හැකියාවන් ඉහළ නැංවීම සඳහා අවම කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සහ නියාමන කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා සංවිධානය තුළ අනුකූලතා අධීක්ෂණ සහ තාක්ෂණික සහාය ඒකකයක් ස්ථාපනය කිරීමට යෝජනා කර ඇත. මෙම ඒකකය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ තාක්ෂණික අංශවල විෂය කරුණු පිළිබඳ විශේෂඥයන්ගෙන් (SMEs) සමන්විත වේ.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ප්‍රවේශ පාලන මධ්‍යස්ථානයේ නව ගුවන් ගමන් කළමනාකරණ (ATM) පද්ධති ස්ථාපනය කර අවසන් කිරීම.
- අතින් ක්‍රියාත්මක කරනු ලබන ගගනනාවුක තොරතුරු සේවයේ (AIS) සිට ස්වයංක්‍රිය ගගනනාවුක තොරතුරු කළමනාකරණය (AIM) වෙත සංක්‍රමණය වීම.
- සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්ම (CAMP) සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම.
- කර්මාන්තය සඳහා නිරපද්‍රතතා කළමනාකරණ පද්ධතිය (SMS) ක්‍රියාත්මක කිරීම.
- සිවිල් ගුවන්සේවා පරිසර ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කර ඇති අතර කැබිනට් අනුමැතිය ලබා ගැනීම.
- ගුවන් සේවා කර්මාන්තයේ සංවර්ධනයට අදාළ පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම.

### 8.6.4 මූල්‍ය කාර්යසාධනය

| | 2023(රු.) | 2022(රු.) |
|---|---|---|
| ආදායම | 5,890,928,454 | 4,268,302,673 |
| වියදම | 973,440,478 | 880,544,000 |

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අදායම ඉකුත් වර්ෂයේ තත්‍ය අදායම වූ රු.මිලියන 4,268 ට සාපේක්ෂව රු.මිලියන 5,890 දක්වා වැඩි වී 38% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. එක්සත් ජනපද ඩොලරයේ විනිමය අනුපාත ඉහල යාම හේතුවෙන් විදේශීය විකුණුම් අධිභාරයෙන් උපයා ගත් අදායම ඉහළ යාම සහ 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මගී ප්‍රවාහනයේ වැඩි වීම අදායම සැලකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු වී ඇත.

2023 වර්ෂයේ රටේ පැවති උද්ධමන තත්වය නිසා පරිපාලන වියදම් ඉහළ යාම හේතුවන් ඉකුත් වර්ෂයේ තත්‍ය වියදම් වලට සාපේක්ෂව තත්‍ය වියදම් 11% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2023 වර්ෂයේ සිවිල් ගුවන්සේවා අධිකාරිය මහා භාණ්ඩාගාරයට රු. බිලියන 4 ක ප්‍රේෂණයක් සිදු කර ඇත.

## 8.7 සී / ස ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

### 8.7.1 හැදින්වීම

සී / ස ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම (AASL) යනු 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත මගින ලබා දී ඇති විධි විධාන යටතේ ව්‍යවස්ථාපිත රාජකාරි ඉටු කිරීම සඳහා 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමකි. එය, ශ්‍රී ලංකාවේ ඇතැම් විශේෂිත සිවිල් ගුවන් සේවාවන් හී එකම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස සිය කාර්යභාර්ය අඛණ්ඩව ඉටු කරයි. දශක හතරක් පුරා රැස් කරගත් රුපියල්

බිලියන 200 කට අධික වත්කම් පදනමක් සහිත සමාගම, තමන්ට පවරා ඇති සේවාවන් සැපයීම සඳහා සේවකයින් 3,900 කින් පමණ සමන්විත ශ්‍රම බලකායක් සේවයෙහි යොදවා ඇත.

**දැක්ම**

"තිරසාර ආර්ථිකයක් සඳහා වූ ගෝලීය සම්බන්ධතාවයේ මිත්‍රශීලී ගුවන් සේවා හවුල්කරු වීම".

**මෙහෙවර**

"පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහතික කරනු වස්, නවීන තාක්ෂණය මුසුකරගත් හොඳම පරිචයන් තුලින්, වඩා තරඟකාරී මෙන්ම ආරක්ෂිත ගුවන් සේවා සැපයීම සහ ඉහල ගුණාත්මකභාවයෙන් යුතු ආගන්තුක අත්දැකීම් ලබාදීම".

**සමාගමේ මූලික ක්‍රියාකාරකම්**

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ, ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළ ගුවන් යානා සහ මගීන්ගේ ආරක්ෂාව සහතික කරමින් කාර්යක්ෂමව ගුවන් මෙහෙයුම් කටයුතු කිරීම සඳහා ගුවන්සන්තරණ සේවා (ගුවන් ගමන් පාලන සේවා, ගගන නාවික සන්නිවේදන සේවා, ගගන නාවික තොරතුරු සේවා) සැපයීම, ගිනි නිවීම් සේවා සැපයීම සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම මෙන්ම ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම,නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම යි. මීට අමතරව යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (JIA) වැනි දුරස්ථ ගුවන් තොටුපළවල් සඳහා බිම් හැසිරවීමේ සේවා සැපයුම්කරු ලෙස AASL කටයුතු කරයි.

## 8.7.2 ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

1. **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (BIA) සංවර්ධන ව්‍යාපෘතිය, දෙවන කොටස - අදියර II**

**A පැකේජය - මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ආශ්‍රිත වැඩ**

දෙවන මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම තුලින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙ හි මගීන් හැසිරවීමේ ධාරිතාව වසරකට මිලියන 15 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරිනි. මගී පර්යන්ත ගොඩනැල්ල ඉදිකිරීමට සමගාමීව ගුවන් පාලම් සහිත නව පිවිසුම් මාර්ග පද්ධතියක්, බහු මහල් රථගාලක්, ජල ටැංකියක්, ජීව වායු සැලැස්මක් සහ කොම්පෝස්ට් පද්ධතියෙන් සමන්විත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක්, මලාපවහන පවිත්‍රාගාරය සහ විදුලිබල සැපයුම් පද්ධතියක් වැනි අනුපූරක පහසුකම් ද වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරිණි.

මූල්‍ය අර්බුධය හමුවේ සියලුම විදේශ ණය ආපසු ගෙවීම් නතර කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණයෙන් පසුව මෙම ව්‍යාපෘතියට අරමුදල් සැපයීමේ නියෝජිතායතනය (JICA) ණය මුදල් මුදාහැරීම නතර කළ බැවින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමත් සමග ඉදිකිරීම් වැඩබිමෙහි නඩත්තු කටයුතු සී/ස ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (ආයෝජකයා) විසින් බාරගන්නා ලදී. ඉදිකිරීම් අතරමග නවතා දැමූ ප්‍රධාන මගී පර්යන්ත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත අරඹන තුරු සිදුවිය හැකි හානිය අවම කිරීමට සිදුකල යුතු හඳුනාගත් ආරක්ෂිත වැඩ, රු.මි. 500 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් වන විට 87% වැඩ නිමවා ඇත. 2023 දෙසැම්බර් මස 31 වන දින දක්වා වැය කර ඇති මුදල රුපියල් මිලියන 140 කි.

2. **BIA හි දැනට පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ල ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම**

මගී අධි-ධාරිතා ගැටළුව සඳහා විසඳුමක් ලෙස, දැනට පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ලෙ හි පවතින ධාරිතාව ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා එහි ඇතැම් ප්‍රතිව්‍යුහගත කිරීම් සහ ප්‍රතිනි මාණ කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

**පැමිණීමේ පර්යන්තයේ නව ඉලෙක්ට්‍රොනික සාප්පු සංකීර්ණයක් ස්ථාපනය කිරීම -** පැමිණීමේ පර්යන්තයේ නව ඉලෙක්ට්‍රොනික සාප්පු සංකීර්ණයක් රු. මිලියන 225 ක පිරිවැයක් දරමින් ඉදිකර 2023 ජනවාරි මාසයේදී මගීන් සඳහා විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ තීරුබදු රහිත ඉලෙක්ට්‍රොනික වෙළඳසැල් 31 ක් පැමිණීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ 2 වන මහල වෙත ගෙන යන ලදී. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පැමිණීමේ පර්යන්තයේ මගීන්ගේ තීරුබදු රහිත සාප්පු සවාරි අත්දැකීම් වැඩි දියුණු කිරීම සහ ගුවන් තොටුපළේ සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණය විය.

**ගෘහ විදුලි උපකරණ වෙළඳසල් සඳහා බන්ධිත ගුදම් ඉදිකිරීම -** 2023 නොවැම්බර් මස මෙම ව්‍යාපෘතිය නිමා කරන ලද අතර එමගින් බන්ධිත ගුදම් ධාරිතාවය ගුදම් 25 කින් වැඩි කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 126 ක් වැය කරන ලදී.

**පවත්නා බන්ධිත ගබඩා දෙකක් සම්බන්ධ කරමින් පාලමක් ඉදිකිරීම** – මෙමගින් මගීන්ට සහ තීරුබදු රහිත වෙළඳසැල්වලට බාධාවක් නොවන පරිදි ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය යටතේ භාණ්ඩ බෙදා හැරීමට පහසුකම් සැලසේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 31.2 කි. එය 2023 සැප්තැම්බර් මාසයේදී නිම කරන ලදී.

3. **BIA හි භාණ්ඩ හැසිරවීමේ ධාරිතාව වැඩි දියුණු කිරීමබණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ගුවන් භාණ්ඩ මෙහෙයුම් ගම්මානයේ ඇතුල්වීමේ පිටවමේ ගොඩනැගිල්ල ඉදිකිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ ගුවන් භාණ්ඩ මෙහෙයවීම සඳහා වර්ග මීටර 575 කින් යුත් දෙමහල් ගොඩනැගිල්ලක් සහ වර්ග මීටර 464 කින් යුත් වාහන අංගනයක් ඉදිකෙරිනි. ව්‍යාපෘතියේ මුළු වටිනාකම රුපියල් මිලියන 136 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු 2022 වසරේ සැප්තැම්බර් මස වැඩ අවසන් කරන ලද අතර මෙහෙයුම් කටයුතු සඳහා 2023 ජනවාරි මාසයේ සිට යොදා ගන්නා ලදී.

4. **ආනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල පළමු අදියර**

ආනයන ගුවන් භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි වාර්ෂික ගුවන් භණ්ඩ හැසිරවීමේ ධාරිතාව මෙට්‍රික් ටොන් 150,000 කින් වැඩි කරයි. රුපියල් බිලියන 2.4 ක් වැය කෙරෙන මෙම ව්‍යාපෘතිය මගින් තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මාර්ග පුළුල් කිරීම සහ වර්ග අඩි 1,620 ක වාහන නැවැත්වීමේ පහසුකම් සැකසීම සිදුකරයි . 2021 ජනවාරි මස ඉදිකිරීම් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය, 2023 සැප්තැම්බර් මාසයේදී නිමකිරීමට බලාපොරොත්තු විය. නමුත්, මෙම ව්‍යාපෘතිය 2023 වසර අවසන් වන විට 88% ක භෞතික ප්‍රගතියක් සහ රුපියල් මිලියන 3,042 ක මූල්‍ය ප්‍රගතියක් පමනක් ලබා ඇත.

5. **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ හා ඒ අවට මාර්ග තදබදය අවම කිරීම සඳහා නව රථවාහන සැලැස්ම**

මෙම ව්‍යාපෘතිය BIA සහ ඒ අවට වාහන තද බදය ලිහිල් කිරීම සඳහා සිදු කරන ලද්දකි. මෙම ව්‍යාපෘතිය සඳහා AASL සහ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) ඒකාබද්ධව අරමුදල් සපයනු ලැබූ අතර AASL සමාගමේ අරමුදල් වලින් රුපියල් මිලියන 600 ක් වැය කෙරිනි. මෙම ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක විය.

- අදියර I – මං සංධිය වැඩිදියුණු කිරීම් ඇතුළුව ඇවරිවත්ත හන්දියේ සිට ආයෝජන මණ්ඩල ප්‍රවේශය දක්වා මීටර් 660ක් දිග, මංතීරු හතරක ද්විත්ව මාර්ගයක් ඉදිකර ඇත.
- අදියර II (A) – මාර්ගය ආශ්‍රිත ජල අපවහන ඇළ මාර්ග ඉදිකිරීම් අවසන් කර ඇත.
- අදියර II (B) – ආයෝජන මණ්ඩල පිවිසුමේ සිට මීනුවන්ගොඩ දෙසට මීටර් 1,050 ක් දිග, මංතීරු හතරකින් යුත් ද්විත්ව මාර්ගයක් ඉදිකිරීම, මං සන්දිය වැඩිදියුණු කිරීම, රථවාහන සංඥා ආලෝක පද්ධතියක් ස්ථාපනය කිරීම සහ BIA හි මගී පර්යන්තය වෙත වෙන් වූ ප්‍රෙවේශ මාර්ගයක් ඉදිකිරීම 2023 නොවැම්බර් මාසයේදී අවසන් කළ අතර එය ජනතා අයිතියට පත් කරන ලදී.

6. වාහන නැවැත්වීමේ පහසුකම් වැඩි දියුණු කිරීම

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි අභ්‍යන්තර හා බාහිර මාර්ග ජාලයේ වෙනස් කිරීම් සමඟ නව මෝටර් රථ ගාලක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත්වීමේ පර්යන්තය ඉදිරිපිට ප්‍රදේශයේ ඉදිකෙරුන අතර 2023 නොවැම්බර් මාසයේදී විවෘත කරන ලදී. මෙම නව මෝටර් රථ ගාලෙහි වාහන 100 ක් පමණ නවතා තැබිය හැකිය.

7. ස්වයංක්‍රිය ආගමන් හා විගමන පාලනය - E-gates ව්‍යාපෘතිය

මිනිස් මැදිහත්වීමකින් තොරව ආගමන හා විගමන පාලන ක්‍රියාවලීන් සිදු කිරීමේ ආරම්භයක් ලෙස BIA හි පිටත්වීම් පර්යන්තයන්තට E-gates හතරක් ස්ථාපනය කිරීමට AASL සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය AASL සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරයි. ජාත්‍යන්තර සංක්‍රමණිකයන්ගේ සංවිධානය (IMO) තවත් විද්‍යුත් දොරටු හතරක් ලබා දීමට එකඟ වී ඇති අතර ඒවා පැමිණීමේ පර්යන්තයේ ස්ථාපනය කිරීමට නියමිතය. මෙමගින් පිටත්වීමේ සහ පැමිණීමේ පර්යන්ත සඳහා විද්‍යුත් දොරටු හතරක් බැගින් ස්ථාපනය කිරීමට හැකි වනු ඇත.මේ සම්බන්ධ කොන්ත්‍රාත් ගිවිසුම 2023 ජූනි 8 වැනි දින අත්සන් කරන ලදී. මේ වනවිට, විදේශීය සැපයුම් කරු විසින් දෘඩාංග සකස් කිරීම ආරම්භ කර ඇති අතර එම යන්ත්‍ර 2024 අප්‍රේල් මස ආරම්භ වන විට BIA වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂිතය.

8. ගගන නාවික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

**ගුවන් ගමන් තොරතුරු කළමනාකරණ පද්ධතිය (Aeronautical Information Management System)** -මෙම ව්‍යාපෘතිය 2023 තුන් වන කාර්තුව අවසානයේ නිම කරන ලදී. නව ගුවන් ගමන් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, ගුවන් ගමන් තොරතුරු කළමනාකරණ සහයෝගිතාවය සඳහා වන ආසියා/පැසිෆික් කලාපීය ක්‍රියාකාරී රාමුව යටතේ වන කාර්ය සාධන වැඩිදියුණු කිරීමේ සැලැස්මේ අවශ්‍යතාවලින් 80%ක් AASL විසින් සම්පූර්ණ කර ඇත. මුළු ව්‍යාපෘති වියදම රුපියල් බිලියන 1.2 කි.

**ගුවන් ගමන් කළමනාකරණ පද්ධතිය (Air Traffic Management System) ස්ථාපිත කිරීම -** ගුවන් ගමන් පාලන මෙහෙයුම් වැඩදියුණු කිරීමේ අරමුණින් බිලියන 1.15 ක් වියදම් කොට නව ගුවන් ගමන් කළමණාකරන පද්ධතිය 2023 වසර අවසන් වන විට ස්ථාපිත කොට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගන්නා ලදී. මෙම පද්ධතිය අවම වශයෙන් ඉදිරි වසර 10 ක භාවිතය සඳහා නිර්මාණය කර ඇත.

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි ගුවන් ධාවන පථයේ 04 අන්තය සඳහා උපකරණ සහාය මත ගුවන් යානා ගොඩබෑමේ පද්ධතියක් (Instrument Landing System) ස්ථාපිත කිරීම -** රුපියල් මිලියන 875 ක් වටිනා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර 2023 තුන්වන කාර්තුව වන විට කොන්ත්‍රාත්තුව අත්සන් කොට ඇත.

**නිරීක්ෂණ රේඩා පද්ධතියක් (Secondary Surveillance Rada System) පිදුරුතලාගල ස්ථාපිත කිරීම -**මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1,710 ක් වැය වෙතැයි ඇස්තමේන්තු කොට ඇති අතර කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කොට ඇත. 2023 වසර අවසන් වන විට, රේඩාර් පද්ධතියේ නිෂ්පාදන ක්‍රියාවලිය, කර්මාන්තශාලාවේදි නිරී ෂණ අනුමැතිය ලබාදීම සහ කර්මාන්තශාලා

පුහුණුව අවසන් කර ඇත. එය සමස්ත ව්‍යාපෘතියෙන් 70% භෞතික ප්‍රගතියක් වේ. ව්‍යාපෘතියට අදාල උපකරණ AASL වෙත ලබාදීමට නියමිතව ඇත.

**ඩිජිටල් හඬ සන්නිවේදන හුවමාරු පද්ධතියක් (Digital Voice Communication *Switching System*) ස්ථාපිත කිරීම -** රුපියල් මිලියන 670 ක වටිනාකමකින් යුත් මෙම ව්‍යාපෘතිය 2023 වසරේදී අවසන් කරන ලදී. මෙම නව DVCS පද්ධතිය මගින් ගුවන් ගමන් පාලකයින් විසින් ගුවන් ගමන් පලන මධ්‍යස්ථානයේ සිට ගුවන් යානා වෙත කරන සන්නිවේදනය ස්වයංක්‍රියව මුදා හැරීමෙන් ඒ සඳහා සිදුකල යුතු සියලු සංකීර්ණ තාක්ෂණික කාර්යයන් මනාව කළමනාකරණය කරයි. ගුවන් ගමන් පාලකවරුන්ට තමා ඉදිරිපිට ඇති තනි ස්පර්ශක තිරයක් හරහා සියලු සන්නිවේදනයන් වෙත ප්‍රවේශය ලබා දෙන බැවින් එය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

## 9. BIA හි සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය

තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ඉදිරියට යමින් විදුලිබල හා බලශක්ති ක්ෂෙත්‍රයේ වර්ධනය වන අභියෝගයන්ට මුහුණ දීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය හා භාවිතය ඉහළ නැංවීමට AASL මෙම ව්‍යාපෘතිය යටතේ පියවර ගෙන ඇත. 2023 නොවැම්බර් මස 20 වන දින, AASL විසින් රුපියල් මිලියන 19 ක් ආයෝජනය කරමින් BIA හි මගී පර්යන්ත ගොඩනැගිල්ලේ වහලය මත 100kWp ධාරිතාවයකින් යුත් සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපිත කරන ලදී. එමගින්, දෛනිකව 600kWh ක් හෝ මසකට 18000kWh විදුලිය උත්පාදනය කළ හැක.

## 10. ව්‍යාවසාය සම්පත් සැලසුම් කිරීමේ (ERP) ව්‍යාපෘතිය

සියලුම තොරතුරු අවශ්‍යතා මෘදුකාංග පද්ධතියක් හරහා ඒකාබද්ධ කිරීම තුලින් රටේ ගුවන් සේවා ඉදිරි සැලසුම් වලට අනුගත වූ ආයතනයේ දැක්ම සහ උපාය මාර්ගික ඉලක්ක වඩා ඵලදායී ලෙස සපුරාලීම අරමුණු කරගත් ව්‍යාවසාය සම්පත් සැලසුම් කිරීමේ (ERP) ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත විය. පළමු අදියර යටතේ, 2021 ජූලි 15 වන දින මුල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ ක්‍රියාවලි/මොඩියුල ක්‍රියාත්මක කරන ලද අතර, මෙම වසර අවසානය වනවිට මෙම ව්‍යාපෘති අදියර සාර්ථක ලෙස නිමකොට ඇත. දෙවන අදියර යටතේ, අනෙකුත් ක්‍රියාවලි/මොඩියුල සඳහා වූ තොරතුරු අවශ්‍යතා හඳුනාගෙන, ඒ එම මොඩියුල ක්‍රියාත්මක කිරීමේ යෝජනා ලබාගැනීමට ඉල්ලුම් කිරීමේ (RFP) ලේඛනයේ ප්‍රධන කොටසක් වන ක්‍රියාකාරි අවශ්‍යතා පිරිවිතර (FRS) මේ වනවිට උපදේශක සමාගම විසින් සකස ඇත. පළමු සහ දෙවන අදියර හි ඇස්තමේන්තුගත පිරිවැය (උපදේශන ඇතුළුව) පිළිවෙලින් රු.මිලියන 160 සහ රු.මිලියන 370 වේ.

## 8.7.3 2023 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

රුපියල් මිලියන

| අයිතමය | 2022 | 2023 විගණනය නොකළ |
|---|---|---|
| ආදායම | 27,577 | 38,376 |
| මෙහෙයුම් වියදම් | 14,941 | 19,061 |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | **12,635** | **19,315** |
| ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය) | (6,202) | 14,324 |
| ණය පොලී | 1,854 | 2,225 |
| විනිමය (ලාභ)/ පාඩුව | 10,555 | (6,121) |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **6,433** | **33,639** |

## 8.8 සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම

### 8.8.1 හැඳින්වීම.

ශ්‍රී ලංකන් ගුවන් සේවය ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවයයි. 1979 දී ආරම්භ කරන ලද ශ්‍රීලංකන් ගුවන් සමාගම ආසියා-පැසිෆික් කලාපයේ වඩාත්ම ගෞරවනීය ගුවන් සේවයක් බවට වර්ධනය වී ඇති අතර ලොව පුරා රටවල් 21 කට අධික සංඛ්‍යාවක ගමනාන්ත 36 කට වැඩි ගණනකට ගුවන් ගමන් ක්‍රියාත්මක කරයි. ශ්‍රීලංකන් ගුවන් සමාගම Oneworld Alliance හි සාමාජිකයෙකි. ආගන්තුක සත්කාර, ශක්තිමත් සහ ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන ශ්‍රී ලංකන් ගුවන් සමාගම මේ සම්බන්ධයෙන් ගෝලීය සම්මාන රැසක් දිනා ඇති අතර ජාත්‍යන්තර මෙහෙයුම් ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන ගුවන් සමාගමක් ලෙස සහතික කර ඇත.

ශ්‍රී ලංකාවේ බොහෝ ව්‍යාපාර පදනම් වී ඇත්තේ සංචාරක ව්‍යාපාරය මත වන අතර, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ආසියාව, ඔස්ට්‍රේලියාව සහ මැදපෙරදිග බොහෝ රටවල් අතර සෘජු මාවත හරහා සම්බන්ධතා සඳහා පහසුකම් සපයයි, ශ්‍රී ලාංකික ඩයස්පෝරාව නිජබිම හා කොළඹ කේන්ද්‍රස්ථානය ලෙස සම්බන්ධ කරයි.

පටු බඳ සහ පුළුල් බඳ සහිත ගුවන් යානා 21 කින් සමන්විත ශ්‍රී ලංකන් ගුවන් සේවය වාර්ෂිකව මගීන් මිලියන 3.5 කට අධික ප්‍රමාණයක් සහ ටොන් 80,000 කට අධික භාණ්ඩ ප්‍රවාහනය කරයි.

### 8.8.2 ශ්‍රීලංකන් එයාර් ලයින් සමාගම ආදායම් ප්‍රකාශය

2023 අප්‍රේල් සිට 2024 පෙබරවාරි දක්වා ( විගණනය නොකරන ලද)

| විස්තරය | අප්‍රේල් 23 සිට මාර්තු 24 දක්වා (USD මිලියන) | අප්‍රේල් 22 සිට මාර්තු 23 දක්වා (USD මිලියන) | අප්‍රේල් 23 සිට මාර්තු 24 දක්වා (LKR මිලියන) | අප්‍රේල් 22 සිට මාර්තු 23 දක්වා (LKR මිලියන) |
|---|---|---|---|---|
| මගී ආදායම | 840 | 835 | 271,554 | 288,279 |
| භාණ්ඩ ආදායම | 98 | 145 | 31,337 | 51,242 |
| වෙනත් ආදායම් | 15 | 14 | 4,878 | 4,862 |
| **මුළු ප්‍රවාහන ආදායම** | **953** | **994** | **307,768** | **344,383** |
| **මෙහෙයුම් වියදම්** | **964** | **941** | **308,304** | **333,365** |
| ගුවන් ප්‍රවාහන ලාභය / (අලාභය) | (11) | 53 | (536) | 11,018 |
| බිම් හැසිරවීම, පුහුණුව ඇතුළු අනෙකුත් ශුද්ධ ආදායම | 50 | 49 | 15,844 | 17,224 |
| **සමාගමේ ශුද්ධ ලාභය/(අලාභය) (මූල්‍ය ගාස්තු සහ විනිමය වෙනස හැර)** | **39** | **103** | **15,309** | **28,242** |
| ශ්‍රී ලංකන් කේටරින් හි ශුද්ධ ආදායම | 16 | 13 | 3,750 | 4,697 |
| අන්තර් සමාගම් ලාභ ඉවත් කිරීම | - | (7) | - | (2,382) |
| **සමූහයේ ශුද්ධ ලාභය/(අලාභය) (මූල්‍ය ගාස්තු සහ විනිමය වෙනස හැර)** | **55** | **109** | **19,058** | **30,557** |
| මූල්‍ය ගාස්තු | (79) | (107) | (25,416) | (38,010) |
| හුවමාරු වෙනස | - | - | 31,440 | (63,496) |
| **කණ්ඩායම් ලාභය / (අලාභය) එක් වර අයිතම වලට පෙර** | **(25)** | **2** | **25,082** | **(70,949)** |

| | | | | |
|---|---|---|---|---|
| Rolls Royce (RR) සඳහා දඩ සහ පොලී සත්කාර කඩකිරීම තෝරන්න | (40) | - | (12,609) | - |
| වර්ෂය සඳහා බදු | - | (1) | - | (357) |
| **කණ්ඩායම් ලාභය / (අලාභය) එක් වර අයිකම වලින් පසුව** | **(64)** | **1** | **12,472** | **(71,307)** |
| ගුවන් ගමන් ගණන | 11,080 | 11,457 | 11,080 | 11,457 |
| 000 හි මගීන් සංඛ්‍යාව | 3,619 | 3,484 | 3,619 | 3,484 |

## 8.9 සීමාසහිත ශ්‍රී ලන්කන් කේටරින් සමාගම

### 8.9.1 හැඳින්වීම

සීමාසහිත ශ්‍රී ලන්කන් කේටරින් ආයතනය 1979 දෙසැම්බර් මස 05 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද අතර 2007 දෙසැම්බර් මස 12 වන දින 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සීමිත වගකීම් සහිත පුද්ගලික සමාගමක් ලෙස නැවත ලියාංපදිංචි කරනු ලැබුවේ කොළඹ - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා පියාසර කරනු ලබන විවිධ ගුවන් සේවා සඳහා ආහාර පාන සැපයීමේ අරමුණ ඇතිවය.

**දැක්ම**
"ආසියාවේ විශිෂ්ඨතම ගුවන්සේවා ආහාර සැපයුම්කරු වීම"

**මෙහෙවර**




### 8.9.2 සේවාවන්

**1. මූලික මෙහෙයුම්**

ශ්‍රී ලන්කන් කේටරින් සමාගම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපළ සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන, වෙත ක්‍රියාත්මක වන සියළු ගුවන් සේවා සඳහා සේවා සපයයි. ගුවන්තොටුපලේ විවේකාගාර සහ ආපනශාලා සඳහා ආහාර සැපයීම, රෙදි සේදීම සහ ආපනශාලා කළමනාකරණය ඇතුළුව සේවාවන් මාලාවක් ද සපයන්නෙමු. ශ්‍රී ලන්කන් කේටරින් ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යය වන්නේ ජාත්‍යන්තර ගුවන් සමාගම් වෙත ගුවන් ගමන් සඳහා ආහාර සේවා සැපයීමයි. ගුවන් යානා ආහාර සැපයීමේ සේවාවන්ට ගුවන් යානා සඳහා ආහාර සැපයීම, විවිධ සේවා (ශීතකළ සහ ශීත නොකළ ගබඩා පහසුකම්, තිරුබඳු රහිත හැසිරවීම්, හෙඩ්සෙට් පරීක්ෂා කිරීම, වෙළඳසැල් මගින් සපයනු ලබන

වෙනත් සේවා ආදිය) ආහාර සැපයීමේ හා හැසිරවීමේ ගාස්තු (පැටවීම, බෑම, සේදීම, ප්‍රවාහනය ආදිය) ඇතුලත් වේ.

**2. සහායක සේවාවන්**

ගුවන් සේවා සඳහා සහ ගුවන් තොටුපල සඳහා ආහාර සැපයීම වන මෙහි ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් අඛණ්ඩව සංවර්ධනය කරන අතරතුර ඉහතින් සඳහන් කළ පරිදි, ව්‍යාපාර පහත සඳහන් සහායක ක්ෂේත්‍රවල මෙහෙයුම් ක්ෂේත්‍ර වෙතද විවිධාංගීකරණයට ලක්කර ඇත;

1. ආපනශාලා අංශය
2. ඉතා වැදගත් පුද්ගල සහ පෞද්ගලික ජෙට් යානා සඳහා ආහාර සැපයීම.
3. සෙරෙන්ඩිවා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල අතරමැදි හෝටලය.
4. ගුවන් කාර්මික රෙදි සෝදනාගාරය
5. වැනිලා පොඩ් බෙලෙන්ජරි සහ පැටිසරී
6. ශීතකළ ආහාර


8.9.3 ආදායම

2023 අප්‍රේල් සිට 2024 මාර්තු දක්වා (විගණනය නොකරන ලද)


| විස්තරය | 2023 අප්‍රේල් සිට 2024 මාර්තු දක්වා | 2022 අප්‍රේල් සිට 2023 මාර්තු දක්වා |
|---|---|---|
| මගී ප්‍රවාහන ආදායම | 13,962,773,225 | 12,536,035,848 |
| භාණ්ඩ ප්‍රවාහන ආදායම | (3,370,566,024) | (3,145,315,047) |
| **වෙනත් ආදායම** | **10,592,207,201** | **9,390,720,801** |
| ශුද්ධ ආදායම | 7,998,194 | 6,809,738 |
| මුළු මෙහෙයුම් පිරිවැය | (2,752,772,330) | (2,709,066,727) |
| ගුවන් ප්‍රවාහනයේ ලාභය / (අලාභය) | (2,060,091,995) | (1,678,147,764) |
| **වෙනත් ව්‍යාපාරික කටයුතුවලින් ලද ලාභය** | **5,787,341,070** | **5,010,316,048** |
| මූල්‍ය පිරිවැයට පෙර ලාභය / (අලාභය) | (1,004,277,883) | 778,531,012 |
| ශුද්ධ ආදායම | (75,378,357) | (88,010,539) |
| **මූල්‍ය පිරිවැයට පෙර ව්‍යාපාර සමූහයේ ශුද්ධ ලාභය / (අලාභය)** | **(1,079,656,240)** | **690,520,473** |
| මූල්‍ය පිරිවැය | 4,707,684,830 | 5,700,836,521 |
| විනිමය හුවමාරු අලාභය | (481,610,316) | (1,003,622,024) |
| **ඒකාබද්ධ ශුද්ධ ලාභය / (අලාභය)** | **4,226,074,514** | **4,697,214,497** |

ඇමුණුම I

<u>සංවිධාන ව්‍යුහය - වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය</u>



ඇමුණුම II


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (නාවික)
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා නීති)
අධ්‍යක්ෂ (බලපත්‍ර)
විභාග පරීක්ෂක (ඉංජිනේරු)
වරාය රාජ්‍ය පාලක (ඉංජිනේරු
රාජ්‍ය නෞකා සමීක්ෂක(ඉංජිනේරු )
ස. අ. (පාලන)
ස. අ. (තො.තා.)
ගණකාධිකාරී
ස. අ. (විභාග)
නීති නිලධාරී
ස. අ. (බලපත්‍ර)
නැව් ලියාපදිංචි හා ව්‍යාපාර සංවර්ධන නිලධාරී
පරිපාලන නිලධාරී
සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක
භාෂා පරිවර්තක
පරිගණක පද්ධති විශ්ලේෂක
නැව් ගමන් නිලධාරී
සහකාර නැව් ගමන් නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
රියදුරු
කාර්යාල කාර්ය සහායක

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. - පීඒඑස්/සී/එම්පීඑස්ඒ /02/23/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date - 2024 මැයි 28 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය.

**ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

2 මූල්‍ය සමාලෝචනය

2.2 වියදම් කළමනාකරණය

2.2.1 ප්‍රතිපාදන උපයෝජනය

(අ) මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 05ක ඇස්තමේන්තුගත එකතුව වූ රු.13,200,000ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.8,348,480ක්වූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 46ක සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) වැය විෂයය 05 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එකතුව රු.310,200,000ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.70,101,520ක් වු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. 61,109,314ක් වූ ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 30ක සිට සියයට 99ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03කට අදාළව එකතුව රු.388,410,000ක් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 12ක් හා සියයට 105ක් අතර පරාසයක පැවතුනි. එසේම එම සලසාගෙන තිබූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් ගෙන් 176-02-4-23-1509 වැය විෂයය යටතේ රු.131,356,467ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එය සලසාගෙන තිබූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 110ක් වී තිබුණි.

(ඉ) රජයේ නිලධාරීන්ගේ භාෂා හැකියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ඒ සඳහා වියදම් දැරීම වෙනුවෙන් වැය විෂය අංක 176-1-2-0-1703 යටතේ රු.50,000ක ප්‍රතිපාදන අයවැයෙන් සලසාගෙන තිබූ අතර මු.රෙ 66/69 යටතේ රු.425,000ක ප්‍රතිපාදන හුවමාරු කරගෙන තිබුණි. නමුත් එම අරමුණින් පරිබාහිරව ආයතනයේ ලිපි ලේඛන පරිවර්තනය කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ එම වැය විෂයෙන් රු.493,314ක වියදමක් දරා තිබූ අතර වියදමේ වෙනස වන රු.18,314ක් බැරකම් ලෙස දක්වා තිබුණි.

2.3 බැදීම් හා බැරකම් වලට එළඹීම

(අ) වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමෙන් උපයෝජනය කිරිම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම් වලට එළඹීම වලක්වාලීමේ අරමුණින් නිකුත් කරන ලද 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම්

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 104 (3) | 2022 අප්‍රේල් 06 දින PG 9548 දරන කැබ් රථය අනතුරකට භාජනය වී තිබුණු අතර විධිමත් පරීක්ෂණයක් කර එහි මූලික පරීක්ෂණ වාර්තාව ලබාදීමට මාස 3 1/2 ට වැඩි කාලයක් ගෙන තිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 1645 | දෙපාර්තමේන්තු වාහන මාණ්ඩලික නිලධාරියකු හෝ වගකිවයුතු නිලධාරියකු හෝ භාරයේ තැබිය යුතු අතර එම නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රය පරිදි වාහන ලොග් සටහන් පොතක් තබාගෙන නිතිපතා එහි ලිවිය යුතු වුවද දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර, වාහනයේ භාරකාරත්වය මාරුකිරීම, ගමන් පිළිබඳ මාසික සාරාංශ සටහන්, පරීක්ෂක නිලධාරින්ගේ සටහන් පිළිබඳ විස්තර අසම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| **(iii)** 2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 12ක කාලසීමාවකට වරක් හෝ කි.මී.25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂාවක් කල යුතු බව දක්වා ඇතත් 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ වාහන සඳහා එම චක්‍රලේඛය අනුව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| **(iv)** 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි | |
| 01 ඡේදය | කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම් සඳහා ආයතනයට සුදුසු ලෙස සකස් කරනු ලබන වාර්ෂික කාර්යසාධන ගිවිසුම් ආයතනයේ සේවයේ නියුතු සමස්ථ |

චක්‍රලේඛයෙහි (ආ) හි දැක්වෙන පරිදි හඳුනාගනු ලැබූ බැඳීම් පදනම් කරගෙන එම බැඳීම් වලට අදාළ භාණ්ඩ හෝ සේවා ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල හා එළඹෙන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සහතික කල වැඩ වල වටිනාකම බැරකමක් ලෙස සටහන් කල යුතු බව දක්වා ඇත. එසේ වුවද 2024 ජනවාරි හා පෙබරවාරි වවුචර්පත් පරීක්ෂාවේදී 2023 වර්ෂය සඳහා වූ බැරකම් අවස්ථා 110කට අදාළව රු.3,088,383ක් මෙම පළමු මාසයන්හි දී නිරවුල් කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශ කට්ටලය තුල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස ඇතුලත් කර තිබුණේ රු.1,561,914.71 වටිනාකමට අදාල බැරකම් පමණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශවල බැරකම් රු.1,526,468 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 92) අනුව අමාත්‍යාංශයට අදාල බැරකම් වාර්තාවේ ඇතුළත් වටිනාකම රු.1,831,314 වන අතර මූල්‍ය ප්‍රකාශ කට්ටලයේ ඇමුණුම iv -1 බැරකම් ප්‍රකාශයෙහි වටිනාකම රු.1,561,914 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ කට්ටලයේ ඇමුණුම iv - බැරකම් රු.269,400ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මු.රෙ 94 (1) වගන්තිය අනුව බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල නොඉක්මවිය යුතු බව දක්වා ඇති අතර වැය විෂයයන් 05කට අදාලව බැරකම් රු.486,479.31ක් ඉතිරිය ඉක්මවා තිබුණි.

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බව දක්වා ඇති නමුත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

කාර්ය මණ්ඩලය සඳහාම අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදු කලයුතු වේ. එසේ වුවද අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සිදුකර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අයවැය ඇස්තමේන්තු මගින් කාර්මික උද්‍යාන/ කලාප සඳහා යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් 176-02-4-27-2506 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන රු.10,000,000ක් වර්ෂය අවසාන වන තෙක්ම උපයෝජනය කර නොතිබුණු අතර ප්‍රතිපාදන ලබා දී තිබුණු ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධයෙන් විමසීමක් කර හේතු දක්වා නොතිබුණි.

#### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

2008 මැයි 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (විශේෂ) අංක 1550/7 අතිරේක සාමාන්‍ය ගැසට් පත්‍රයේ 07 සහ 08 රෙගුලාසි අනුව, ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශපත්‍රයක් සම්බන්ධයෙන්ම ඇමෙරිකානු ඩොලර් 60ක අධිභාරයක් (OSS Levy) හෝ එම මුදලට සමාන මුදලක් අය කළ යුතු අතර, එසේ අය කරනු ලබන අධිභාරය, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව දක්වා ඇතත් 2008 සිට 2024 මාර්තු දක්වා කාලය තුළ එකතු කරන ලද රු.22,113,189,430 ක් වූ අධිභාරය සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

(අ) කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු ආනයන හා අපනයන Exim බැංකුව අතර ඇමරිකානු ඩොලර් මිලියන 45.27ක ණය මුදලක් ලබා ගැනීමට ඩොලර් ණය ගිවිසුමකට 2018 ජනවාරි 10 දින අත්සන් තබා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුම අත්සන් කර වසර 04 කටත් වැඩි කාලයක් ගතවී ඇතත් වරායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීමේ වැඩකටයුතු 2021 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) 2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුල කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 360ක ප්‍රතිපාදනය සලසාගෙන තිබුණි. එම ප්‍රතිපාදන සලසාගෙන තිබුණේ ප්‍රධාන වැය සඳහා රු. මිලියන 300ක් හා බදු සඳහා රු.මිලියන 60ක් වශයෙනි. එසේ වුවද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ වලට අනුව ඉහත සලසාගෙන තිබූ ප්‍රතිපාදන මුදල වන රු. මිලියන 300න් කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව ප්‍රතිපාදන සියයට 100 ඉතිරිව තිබුණි.

## 3.3 පාඩු හා හානි

2022 අප්‍රේල් 06 දින PG 9548 දරන කැබ් රථය අනතුරකට භාජනය වී තිබූ අතර එහි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.587,480ක මුදලක් වැයකර තිබුණි. එහෙත් රක්ෂණ ආයතනය විසින් ගෙවීමට එකඟ වී තිබුණේ රු.250,000ක මුදලක් පමණි. වාහනය අනතුරට භාජනය වීමෙන් වූ හානිය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා රක්ෂණ ආයතනයෙන් පූර්ණ වන්දි මුදල් ලබාගැනීමට හෝ රියදුරු විසින් ගෙවා පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තිබිය යුතු කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් රජයට රු.337,480ක පාඩුවක් සිදුවී තිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2004 ඔක්තොබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණයශේෂ මාස 03ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙන් බාහිර ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරින් දෙදෙනෙකුට අයත් වර්ෂ 20කට අධික කාලයක සිට පැවැත එන එකතුව රු.119,200ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වැඩ තහනම් කර තිබුණු නිලධාරියෙකුගෙන් අමාත්‍යාංශය වෙත අය විය යුතුව තිබුණු රු.293,470ක ණය ශේෂය වර්ෂ 20කට අධික කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. මෙම නිරවුල් නොවූ ණය ශේෂයන් දිගින් දිගටම ණය ලේඛනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 20 | 02 |
| තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| ද්විතියික මට්ටම | 61 | 56 | 05 |
| ප්‍රාථමික මට්ටම | 27 | 27 | 00 |
| එකතුව | 113 | 104 | 09 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ස්ථිර කාර්යමණ්ඩලයේ මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 09ක් වී තිබුණි. එම පුරප්පාඩු පිරවීම සඳහා වාර්තාවේ දිනය දක්වා නොහැකි වී තිබුණි.

එම්.ආර්.ආර්.කේ.මල්ලව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව